මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යාංශය
நிதி மற்றும் வெகுசன ஊடக அமைச்சு
MINISTRY OF FINANCE AND MASS MEDIA




# 2014

# වාර්ෂික වාර්තාව
# வருடாந்த அறிக்கை
# ANNUAL REPORT

සැලසිනෙ
செலசினே
SELACINE
SELACINE TELEVISION INSTITUTE

## සැලසිනෙ රූපවාහිනී ආයතනය

# වාර්ෂික වාර්තාව
# සහ
# ගිණුම් ප්‍රකාශනය

2014 ජනවාරි මස 01 වෙනි දින සිට 2014 දෙසැම්බර් 31 වෙනි දින දක්වා

ගරු මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යතුමා
මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යාංශය
කොළඹ 05.

ගරු අමාත්‍යතුමනි,

**වාර්ෂික වාර්තාව - 2014**

1971 අංක 38 දරන මුදල් පනතේ 14 (1) වගන්තිය ප්‍රකාරව 2014 දෙසැම්බර් 31 දිනට අවසන් වර්ෂය වෙනුවෙන් සැලසිනෙ රූපවාහිනී ආයතනයේ වාර්ෂික වාර්තාව ගෞරවයෙන් ඉදිරිපත් කරමි.

ශාන්ත බණ්ඩාර ජයවර්ධන
සභාපති
සැලසිනෙ රූපවාහිනී ආයතනය
කොළඹ 07.

# පෙළ ගැස්ම


| | |
|---|---|
| දැක්ම, මෙහෙවර, අරමුණු | 07 |
| සභාපතිතුමාගේ සමාලෝචනය | 08 |
| පරිපාලන ව්‍යුහය 2014 හා සම්බන්ධීකරණ තොරතුරු | 09 |
| ආයතනික තොරතුරු | 10 - 12 |
| මූල්‍ය වාර්තා | 13 - 17 |
| ආදායම් ප්‍රකාශය | 18 |
| ශේෂ පත්‍රය | 19 |
| මුදල් ප්‍රවාහ ප්‍රකාශය | 20 |
| මූල්‍ය වාර්තා සඳහා සටහන් | 21 - 26 |
| 2014 වර්ෂයේ මූල්‍ය ක්‍රියාකාරීත්වය පිළිබඳ විගණකාධිපතිතුමාගේ මතය | 27 - 36 |
| 2014 වර්ෂයේ විගණකාධිපතිතුමාගේ වාර්තාව සඳහා පැහැදිලි කිරීම් | 37 - 40 |

## දැක්ම

රාජ්‍ය යාන්ත්‍රණයේ සංවර්ධන හා මෙහෙයුම් සහ සියලු ව්‍යාපාර ක්ෂේත්‍රයන්හි ප්‍රවර්ධනයන් නිර්මාණාත්මකව සන්නිවේදනය කිරීම තුළින් ප්‍රචාරණ ක්ෂේත්‍රයේ ප්‍රමුඛයා වීම.

## මෙහෙවර

නිපුණත්වයෙන් හෙබි වඩාත් නිර්මාණශීලී හා දිරිමත් පුද්ගල සහය භාවිතා කරමින් උපක්‍රමශීලිත්ව මෙන්ම උසස් තලයේ තාක්ෂණය ද නිර්මාණාත්මකව උපයෝගී කරගනිමින් රාජ්‍ය සහ පෞද්ගලික ආයතන සඳහා සන්නිවේදන සහ වෙනත් නිර්මාණශීලී ප්‍රචාරාත්මක අනගි සේවාවක් සැපයීම තුළින් ශ්‍රී ලංකාවේ ආර්ථික, සමාජීය සහ දේශපාලන සංවර්ධනය සඳහා සක්‍රීයව දායක වීම.

## අරමුණු

- මූල්‍ය තත්ත්වය ඉහළ දැමීම.
- වෙළෙඳපොල ලාභය ඉහළ දැමීම.
- සේවාලාභී සංස්කෘතිය ඉහළ දැමීම සඳහා වූ උපක්‍රම ක්‍රියාත්මක කිරීම.
- ආයතන සේවකයින් සහ නායකයින් වර්ධනය කිරීම.

# සභාපතිතුමාගේ සමාලෝචනය



**ශාන්ත බණ්ඩාර ජයවර්ධන - සභාපති**
සැලසිනෙ රූපවාහිනී ආයතනය

"සැලසිනෙ රූපවාහිනී ආයතනයේ වත්මන් සභාපතිවරයා වශයෙන් මා පත්ව ඒමට පෙර යුගයට අදාළ 2014 වාර්ෂික වාර්තාවට පණිවුඩයක් එක් කිරීමට ලැබීම සතුටට හේතුවකි.

යුගයක් පුරා අනේක විධ පැණසර මතින් ආ ගමනේ වඩා ආලෝකමත් ආනාගතයක් කරා යන්නට වෙර දරන සමයක ආයතනය කිසියම් වූ ප්‍රගතියක් අත්කර ගැනීමට 2014 වර්ෂයේ ද කටයුතු කරන්නට ඇත.

පරිපාලන හා ගිණුම්කරණ කටයුතුවල කිසියම් අගය කළ හැකි කාර්යක්ෂමතාවයක් විද්‍යාමානව තිබීම පැසසුම් කළ යුතුය. නියමිත ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූලව ගිණුම් ඉදිරිපත් කිරීමට උත්සාහ ගෙන ඇති අතර, පෙර ආයතනික වර්ෂ දෙකම විගණකාධිපති මාතය හොඳ ප්‍රතිචාර සහිත වීම එය සනාථ කර ඇත.

චෝගම් සහ රන්මිහිතැන්න වැනි අතිශය වැදගත් ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ දී එහි ඉසව් සංවිධානය සැලසිනෙ ආයතනයට හිමි විය. මෙම කටයුතු සාර්ථක ලෙස අවසන් කිරීමට හැකි වීම පැසසිය යුතු කරුණකි.

වසර ගණනක් තුළ ලේක්හවුස් ආයතනයට වැඩි ම දැන්වීම් ප්‍රමාණයක් ලබාදීමට ග්‍රැෆික් අංශය මගින් ඉතා හොඳ දායකත්වයක් ලබා දී ඇත. මාධ්‍ය අංශය විසින් මෙම සුවිසාල දැන්වීම් ප්‍රමාණය උපලේඛන ගත කිරීමේ කාර්යය මැනවින් ඉටුකර ඇත.

නිෂ්පාදන අංශය මගින් සැලකිය යුතු දායකත්වයක් ලබාදීම සිදු වී ඇති අතර, අලෙවිකරණ අංශය විසින් පෙරට වඩා වැඩි ප්‍රමාණයක් ගනුදෙනුකරුවන් ග්‍රහණය කර ගැනීම තුළින් දැන්වීම් වැඩි ප්‍රමාණයක් ලබා ගැනීමට දායක වී තිබේ.

2013 වර්ෂයට වඩා 2014 වර්ෂයේ ආදායම රු. මිලියන 203.1 කින් අඩු වී ඇත. මෙම අඩු වීමට සෘජුව බලපාන ලද්දේ 2013 වර්ෂයේ දැයට කිරුළ ප්‍රදර්ශන කුටි රාශියක් ඉදි වූ අතර, ඊට අදාළව පුවත්පත් දැන්වීම් විශාල ප්‍රමාණයක් ලැබීම තුළින් ආදායම් වැඩි වීමත්, 2014 වර්ෂයේ දී අපේක්ෂිත පරිදි එවැනි ව්‍යාපෘති සඳහා දායක වීමට නොහැකි වීම හේතුකොට ගෙනය.

පසුගිය කාලසීමාවේ සිදු වූ ගැටලු දුෂ්කරතා මධ්‍යයේ පැමිණි මෙම ගමන වඩාත් උපක්‍රමශීලි ලෙස අභියෝගාත්මකව ඉදිරියට ගෙනයෑමට හැකිවන ලෙස කටයුතු කිරීම හා ආයතනය නිවැරදි නීතිමය රාමුවක් තුළ ස්ථානගත කිරීමේ අපේක්ෂාවට අවශ්‍ය ශක්තිය, ධෛර්යය ආයතනය සතු පැවතීම අගය කළ යුතුය."



සැලසිනෙ SELACINE

## පරිපාලන ව්‍යුහය - 2014

### ජ්‍යෙෂ්ඨ කළමනාකාරිත්වය

| | |
|---|---|
| ප්‍රදීප් එදිරිසිංහ | - සභාපති |
| රන්ජන් ඒකනායක | - සාමාන්‍යාධිකාරී (වැ.බ.) |

### කළමනාකරණය

| | |
|---|---|
| පුෂ්පා බමුණුආරච්චි | - කළමනාකරු (මානව සම්පත් හා පරිපාලන) |
| සුනන්ද වීරසිංහ | - කළමනාකරු (නිෂ්පාදන) |
| ප්‍රසන්න ඕපාත | - පාරිභෝගික සේවා අධ්‍යක්ෂ |
| නලීන් අලහකෝන් | - කළමනාකරු (මාධ්‍ය) |
| කේ. ඩී. ජේ. ද ලාසාල් | - කළමනාකරු (මූල්‍ය) |
| සුජිත් පුෂ්පකුමාර | - කළමනාකරු (වැ.බ.) (ග්‍රැෆික්) |

### විගණක

රජයේ විගණකාධිපති දෙපාර්තමේන්තුව

### බැංකුකරුවන්

ලංකා බැංකුව

## සම්බන්ධීකරණ තොරතුරු

### ලිපිනය

ගුවන් විදුලි සංස්ථා අභ්‍යාස ගොඩනැගිල්ල, නිදහස් චතුරස්‍රය, කොළඹ 07

### දුරකථනය

011 2688744 /011 5767979/ 011 5235480

### ෆැක්ස්

011 2688745

### විද්‍යුත් තැපෑල

selacine@gmail.com

### වෙබ් අඩවිය

www.selacine.lk

## ආයතනික තොරතුරු

**නාමය** : සැලසිනෙ රූපවාහිනී ආයතනය

**නීතිමය ස්වරූපය හා අතීත කාර්ය ස්වභාවය :**

- 1982 පෙබරවාරි 01 දින සැලසුම් ක්‍රියාත්මක කිරීමේ අමාත්‍යාංශයේ අධිකාරිත්වය යටතේ ආරම්භ විය.
- 1982 සිට 1989 දක්වා ඉඩම්, වාරිමාර්ග හා මහවැලි සංවර්ධන අමාත්‍යාංශය යටතේ වූ රාජ්‍ය දැව සංස්ථාවේ මානව හා මූල්‍ය සම්පත් යටතේ මහවැලි කඩිනම් සංවර්ධන වැඩසටහන පිළිබඳ ශ්‍රී ලාංකීය ජනතාව දැනුවත් කිරීමේ කාර්යය සිදුකිරීම.
- 1989 ජනසවිය වැඩසටහනේ ප්‍රචාරාත්මක කාර්යභාරය සිදුකිරීම
- 1989.08.19 දිනැති අංක 832/15 දරන අති විශේෂ ගැසට් නිවේදනය මගින් සැලසිනෙ ආයතනය යෞවන කටයුතු, ක්‍රීඩා හා ග්‍රාම සංවර්ධන අමාත්‍යාංශය යටතට පවරන ලදී. (මෙය ආයතනය සම්බන්ධව ගැසට් නිවේදනයක් මගින් කරනු ලැබූ පළමු පැවරීමයි)
- 1997.06.09 දිනැති අංක 979/2 දරන අති විශේෂ ගැසට් නිවේදනය මගින් තැපැල්, විදුලි සංදේශ හා ජනමාධ්‍ය අමාත්‍යාංශය වෙත පවරන ලදී.
- 2001. 12. 20 දිනැති 1215/14 දරන අති විශේෂ ගැසට් නිවේදනයට අනුව ජනසන්නිවේදන අමාත්‍යාංශය යටතට පවරාගන්නා ලදී.
- 2004. 04. 28 දිනැති 1338/9 දරන අති විශේෂ ගැසට් නිවේදනය තුළින් තොරතුරු හා මාධ්‍ය අමාත්‍යාංශයට අයත් ආයතනයක් ලෙස නම් කරනු ලැබීය.
- 2005/12/08 දිනැති 1422/22 දරන අති විශේෂ ගැසට් නිවේදනයට අනුව ජනමාධ්‍ය හා තොරතුරු අමාත්‍යාංශයට අයත් ආයතනයක් ලෙස ස්ථාපිත කරනු ලැබීය.
- 2007 අංක 07 දරන සමාගම් පනතෙහි විධිවිධානයන්ට අනුව පූර්ණ අයිතිය රජයට හිමි පොදු සමාගමක් බවට පත්කිරීම සඳහා අමාත්‍ය මණ්ඩලය වෙත 2008. 03. 26 දිනැති සන්දේශය ඉදිරිපත් කෙරුණි.

### ආයතනික කාර්ය භාරය :

- රජයේ මාධ්‍ය ප්‍රචාරණ හා නිෂ්පාදන ආයතනය ලෙස ක්‍රියාත්මක වීම.
- 2005. 05. 16 දින අංක 1380/15 දරන අති විශේෂ ගැසට් නිවේදනය මගින් පහත සඳහන් කරුණු කාර්ය විෂය පථයට ඇතුළත් කෙරුණි.
  - i මුද්‍රිත / විද්‍යුත් මාධ්‍ය දැන්වීම් නිෂ්පාදනය
  - ii රජයේ සංවර්ධන ක්‍රියාදාමයන් පිළිබඳව ජනතාව දැනුවත් කිරීමේ ප්‍රචාරක කටයුතු
  - iii රජයේ ප්‍රචාරක වැඩසටහන් නිෂ්පාදනය
- 2008. 12. 02 දිනැති ජනමාධ්‍ය හා තොරතුරු ගරු අමාත්‍යතුමාගේ සංදේශය සම්බන්ධ නිරීක්ෂණයෙන් අනතුරුව 2008. 12. 24 දිනැති අංක 08/2253/338/043 දරන අමාත්‍ය මණ්ඩල පත්‍රිකාව මගින් සියලුම අමාත්‍යාංශ හා ඒවා යටතේ ඇති ආයතනවල සියලුම වෙළෙඳ දැන්වීම් හා ප්‍රචාරාත්මක වැඩසටහන් සැලසිනෙ රූපවාහිනී ආයතනය මගින් ඉටුකරවා ගැනීම අනිවාර්ය කිරීම සඳහා අනුමැතිය ලබාදෙන ලදී.
- රූපවාහිනී වාර්තාමය වැඩසටහන්, ගුවන් විදුලි වැඩසටහන් මෙන්ම රූපවාහිනී හා ගුවන් විදුලි වෙළෙඳ දැන්වීම් යනාදී ශ්‍රව්‍ය දෘශ්‍ය නිර්මාණයන් නිෂ්පාදනය කිරීම
- විවිධ වූ පුවත්පත් දැන්වීම් නිර්මාණය මෙන්ම එම දැන්වීම් විද්‍යුත් හා මුද්‍රිත මාධ්‍යයන්හි උපලේඛනගත කිරීම.
- ඉසව් කළමනාකරණය හා මුද්‍රණ කටයුතු.

## මානව සම්පත් හා පරිපාලන අංශය

ආයතනයක ප්‍රධාන ම සම්පත වන්නේ මානව සම්පතයි. එබැවින් මානව සම්පත දිරිගැන්වීම උදෙසා ආයතනය ද මූලිකත්වය ලබාදෙන ලදී. ගුණාත්මක භාවයෙන් ඉහළ නංවන ලද මානව සම්පත තුළින් වඩාත් ඵලදායී සේවාවක් ලබාගත හැකි බව එතුළින් පැහැදිලි වී ඇත.

2014 වර්ෂයේ මානව සම්පත් ඉලක්ක කර බාහිර උපදේශක සේවා ලබාදීම මත ආයතනයේ මෙන්ම පෞද්ගලිකව සේවක අභිවෘද්ධිය උදෙසා ක්‍රියාත්මක වූ බව පෙන්නුම් කෙරේ.

සේවකයින්ගේ අභිවෘද්ධිය හා සේවක සුභසාධනය උදෙසා ණය පහසුකම් ලබාදීම, උත්සව අත්තිකාරම් ලබාදීම, උත්සව සමයේ තෑගි වවුචර් ලබාදීම හා ප්‍රසාද දීමනා ලබාදීම සිදුකරන ලදී. ආයතනයේ අභිවෘද්ධියට ඉවහල් වන පරිදි පෞද්ගලිකව සේවකයින්ට අවශ්‍ය පුහුණුවීම් අවස්ථාව ලබාදෙන ලදී.

සේවක දිරි ගැන්වීමේ ක්‍රමයක් වශයෙන් පැමිණීම සඳහා ලබාදුන් දිරිගැන්වීමේ දීමනා තවදුරටත් ක්‍රියාත්මක කරන ලදී.

ආයතනයේ ඵලදායීතාව ඉහළ නැංවීම සඳහා වූ පියවරක් වශයෙන් ඔවුන් ඉල්ලා ඇති නවීන අංගයක් වන කැමරා, පරිගණක යන්ත්‍ර, ලැප්ටොප් පරිගණක යන්ත්‍ර හා කාර්යාලීය උපකරණ ආදිය හැකිතාක් ලබාදෙන ලදී.

මින් ඉදිරියට ද මානව සම්පත දිරිගැන්වීමෙහිලා අවශ්‍ය මානසික හා තාක්ෂණික සාධක ලබාදීමට මෙම අංශය කැපවී සිටියි.

## අලෙවි හා පාරිභෝගික අංශය

පසුගිය වසර හා සැසදීමේ දී මෙම අංශය තුළින් විශේෂිත වූ ප්‍රගතියක් අත්පත් කරගනු ලැබිණි. තවද අලෙවි නිලධාරීන්ගේ හැකියාවෙන් ප්‍රවර්ධනය කරනු වස් විශේෂිත වැඩමුළු කිහිපයක් ඉතා සාර්ථක අයුරින් නිමකරලීමට හැකිවීම සුවිශේෂී කරුණකි. ක්‍රමානුකූලව සියලු කළමනාකරුවන්ගේ සහයෝගය මත මෙම වසරෙහි අලෙවි ආදායම මිලියන 450 දක්වා ප්‍රවර්ධනය කරගැනීමට ලැබීම කැපී පෙනෙන ලක්ෂණයන් අතර විශේෂනේ රට තුළ පැවැති මැතිවරණ වටපිටාව තුළ මෙම ඉලක්කගත ආදායම ලබා ගැනීමට හැකිවිය.

## මූල්‍ය අංශය

පසුගිය කාලපරිච්ඡේදය සමඟ සැසදීමේ දී 2014 වර්ෂය තුළ මුදල් අංශයට විශාල අභියෝගතා රාශියකට මුහුණදීමට සිදුවිය. අලෙවි ආදායම අනපේක්ෂිත ලෙස පහළ යෑම මෙම කරුණුවලින් ප්‍රධාන තැනක් ගත් අතර මෙම අහිතකර වාතාවරණය තුළ ආයතනයට පෙර වර්ෂවල දී දැරූ වියදම් ඒ ආකාරයෙන් ම පැවතෙද් දී ආදයම් අඩුවීම දක්නට ලැබූ අතර, මෙහි දී තීරණ ගැනීමේ දී වඩාත් ප්‍රවේශම්කාරී ප්‍රවේශයන්ට එළැඹීමට සැමවිටම සිදු විය.

අභ්‍යන්තර විගණන අංශය පිහිටුවීමෙන් අනතුරුව ආයතනයේ මූල්‍ය කටයුතු හොඳින් කරගෙන යෑමට අවශ්‍ය සැලසුම්, වැඩපිළිවෙල ක්‍රියාත්මක කිරීම සිදුකරන ලදී. ඒ තුළින් වාර්තා කඩිනමින් අමාත්‍යාංශය වෙත යැවීමට ද හැකි විය. අමාත්‍යාංශය විසින් ඉල්ලනු ලබන මූල්‍ය වාර්තා නිසි පරිදි ලබාදීමට ද කටයුතු කරන ලද අතර, ඒ සඳහා පරිගණක පැකේජය යොදා ගැනීම තුළින් වැඩි කාර්යක්ෂමතාවක් ඇති කිරීමට ද හේතු වියී

විගණකාධිපතිගේ වාර්තාවේ පෙන්වන කරුණු නිවැරදිකර ගැනීමටත් 2014. 12. 31 වෙනි දිනෙන් අවසන් වූ ගිණුම් වර්ෂය සඳහා මූල්‍ය ක්‍රියාකාරකම් හා මුදල් ප්‍රවාහය ශ්‍රී ලංකා ගිණුම් ප්‍රමිතීන්ට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයෙන් පිළිබිඹු කෙරෙන ලෙස ගිණුම් ප්‍රකාශන යාවත්කාලීන කර ඇත.

ගිණුම් අංශයේ සියලුදෙනා තමාට අදාළ කාර්යයන් පිළිබඳව නිවැරදිව හා නිසි වේලාවට සිදුකිරීමට මහත් ප්‍රයත්නයක් දරා ඇත.

2014 වර්ෂයේ පැවති නිලධාරීන්ගේ හිඟය නිසා මූල්‍ය අංශයේ කටයුතු සෙමින් සිදු වුවද, අවශ්‍ය සියලු දෑ නිසි පරිදි සිදුකිරීමටත්, මූල්‍ය තොරතුරු නිසි පරිදි ලබාදීමත් තුළින් ගිණුම් අංශයේ ප්‍රගතියක් අත්පත් කරගැනීමට ද සමත් විය.

## නිර්මාණ සහ ග්‍රැෆික් අංශය

"සැලසිනෙ රූපවාහිනී ආයතනය විසින් අන්තර් අංශ ඇගයීම් කාර්යය සාධන තරඟාවලිය පැවැත් වූ 2011 සහ 2013 වර්ෂ දෙකෙහිදී ම විශිෂ්ටතම කාර්යය සාධන අංශය ලෙස නිර්මාණ සහ ග්‍රැෆික් අංශය කිරුළු පැළඳීය.

වේලාවන් කෙරෙහි තැකීමක් නොකර තම වෘත්තීය කාර්යය භාරය නොපිරිහෙලා ඉටු කිරීමට සමත් පළපුරුදු වෘත්තීය ග්‍රැෆික් නිර්මාණකරුවන් පිරිසකගෙන් සමන්විත මෙම අංශය බොහෝවිට හදිසි කාර්යයන් සඳහා ද තම දායකත්වය සපයයි.

පුවත්පත් දැන්වීම් නිර්මාණකරණය, ත්‍රිමාණකරණය, ත්‍රිමාණ සජීවිකරණය, වාර්ෂික වාර්තා සහ විවිධ වූ ප්‍රකාශන සම්පාදනය, පෝස්ටර් හා බැනර් නිර්මාණය ඇතුළු ප්‍රධාන භාෂා පරිවර්තන කාර්යයන් හි ද කේන්ද්‍රස්ථානය වනුයේ නිර්මාණ හා ග්‍රැෆික් අංශයයි.

ලේක්හවුස් ආයතනය පල කරන දෛනික පුවත්පත් දැන්වීම් අතුරින් වැඩිම දැන්වීම් ප්‍රමාණයක් නිර්මාණය කරන සැලසිනෙ රූපවාහිනී ආයතනය එහි වගකීම භාරදී තිබෙනුයේ නිර්මාණ හා ග්‍රැෆික් අංශය වෙතය.

නියමිත කාලය තුළ ඉතා නිවැරදිව හා ආකර්ෂණීය ලෙස දැන්වීම් නිර්මාණකරදීමේ වගකීම මෙම අංශය වෙත පැවරී ඇති හෙයින් 2014 වසර තුළ දී ද එම කාර්යයභාරය මනාව ඉටු කිරීමට නිර්මාණ හා ග්‍රැෆික් අංශය සමත්ව ඇති බව සැලසිනෙ ආයතනය වෙත අඛණ්ඩව ලැබෙන ආදායම් මගින් පෙන්නුම් කෙරේ."

## නිෂ්පාදන අංශය

"සැලසිනෙ හදවත බඳු නිෂ්පාදන අංශය 2014 වසරේ දී නිර්මාණශීලි හරවත් නිර්මාණ රැසක් නිපදවමින් විශාල ප්‍රගතියක අත්කර ගැනීමට සමත් විය. රූපවාහිනී වර්තා වැඩසටහන්, ගුවන්විදුලි හා රූපවාහිනී වෙළෙඳ දැන්වීම් ඇතුළුව විවිධ ශ්‍රව්‍ය දෘෂ්‍ය මාධ්‍ය නිර්මාණ රැසක් සිදුකිරීමට නිෂ්පාදන අංශයේ සෑම ශිල්පියෙකු ම හෙළූ දහඩිය මහන්සිය ඉමහත් ය.

නිෂ්පාදනයක සංකල්පය බිහි වන තැන සිටම නිර්මාණශීලි පිටපතක් බිහිකර ඒ ඔස්සේ වැඩසටහන නිපදවා සංස්කරණය කිරීම මෙන්ම, අවසානයේ සාර්ථක ඵලයක් බිහිකර ගැනීම උදෙසා නිෂ්පාදන අංශයේ සෑම ශිල්පියෙකුගෙන්ම හිමි වූ කැපවීම, කුසලතාවය මෙන්ම සහෝදරත්වය ද ඉමහත් ය. ඔවුන්ගේ දහඩිය මහන්සියේ සරුඵලය 2014 වසරේ දී සැලසිනෙ රූපවාහිනී ආයතනය සාඩම්බරව නෙළා ගන්නා ලදී.

පිටත වටරවුම් මාර්ගය පිළිබඳ ප්‍රචාරක දැන්වීම්, ජාතික උරුමයන් පිළිබඳ අමාත්‍යාංශය වෙනුවෙන් නිපදවන ලද වාර්තා වැඩසටහන, මාර්ගාරක්ෂාව පිළිබඳ ජාතික සභාව විසින් නිෂ්පාදනය කරන ලද වාර්තා වැඩසටහන, ජන හා සංඛ්‍යාලේඛණ දෙපාර්තමේන්තුවේ ජන සංගණනය පිළිබඳ දැන්වීම්, අපජල කළමනාකරණය පිළිබඳ වාර්තා වැඩසටහන සහ කොළඹ කටුනායක අධිවේගී මාර්ගය පිළිබඳ දැන්වීම් ආදිය ප්‍රේක්ෂක හදවත් හි අදටත් රැඳී තිබෙනා නිර්මාණයන් ය.

නිර්මාණශීලි කුසලතාවයන් නිරතුරුව ඔපදමා ගනිමින්, දියුණු වන තාක්ෂණයත් සමඟ හරි හරියට පිය නගමින් ඉදිරියටත් හරවත් ගුණාත්මක මාධ්‍ය මෙහෙවරක යෙදීමට සැලසිනෙ නිෂ්පාදන අංශයෙ අප සූදානම්."

## මාධ්‍ය අංශය

"මාධ්‍ය අංශයේ ප්‍රමුඛ කාර්යභාරය වන විද්‍යුත් හා මුද්‍රිත මාධ්‍යයන් හි දැන්වීම් සහ ශ්‍රව්‍ය දෘශ්‍ය නිර්මාණ උපලේඛනගත කිරීම් ය. එය සෑම වර්ෂයක ම වැඩිම ආදායම් උපදවන්නේ මාධ්‍ය අංශයේ උපලේඛනගත කිරීම් තුළිනි. ඒ අනුව 2014 වර්ෂයේ ද වඩාත් කාර්යක්ෂමව සිදු කරන ලදි. මෙහිදී සමස්ත ආයෝජන රුපියල් මිලියන 334 (334,587,225.95) කි.


2014 වර්ෂයේ ද ලේක් හවුස් පුවත්පත් ආයතනය වෙත වැඩිම දැන්වීම් ප්‍රමාණයක් ලබාදෙන ලදී.

2014 වර්ෂය තුළ දී කොළඹ පිටත වටරවුම් මාර්ගය, දක්ෂිණ අධිවේගී මාර්ග ව්‍යාපෘතිය සහ විදේශ සේවා නියුක්ති කාර්යාංශය වෙත කරන ලද දැන්වීම් සහ නිර්මාණයන් සේවාදායකයා බලාපොරොත්තු වූ ඉලක්කයන් කරා යෑමට සැලසුම් සහගත ලෙස මාධ්‍ය සැලසුම් සකස් කිරීම අප ලැබූ ජයග්‍රහණයකි.


ඒ අනුව ශ්‍රී ලංකාවේ ප්‍රමුඛ පෙළේ දැන්වීම් ප්‍රචාරණ නියෝජිත ආයතනයක් ලෙස අපගේ නිර්මාණ කාර්යයන් පමණක් නොව ප්‍රචාරණයේ ඉහළ මට්ටමේ හැකියාවන් සැලසිනෙ සතු බව මෙයින් පෙන්නුම් කෙරේ."

# මූල්‍ය වාර්තා 2014


## ආදායම් වර්ධනය




### පසුගිය වසර පහ තුළ දළ ලාභය



2010 - 2014 වර්ෂයන් අතර ආයතනික ආදායම සහ සෘජු වියදම් අතර උපනතිය



# මූල්‍ය වාර්තා සඳහා සටහන්

## 2014 දෙසැම්බර් මස 31 වෙනි දිනෙන් අවසන් වූ වසර සඳහා ගිණුම් ප්‍රතිපත්ති

### 1. පොදු කරුණු

**1.1 සංයුක්ත තොරතුරු**

සැලසිනෙ රූපවාහිනී ආයතනය (මින් පසු සැලසිනෙ නාමයෙන් හැඳින්වෙන) 2005.12.08 වෙනි දිනැති අංක 1422/22 දරන අති විශේෂ ගැසට් නිවේදනය මගින් ජනමාධ්‍ය හා තොරතුරු අමාත්‍යාංශයෙහි විෂය පථයට ඇතුළත් කෙරිණි.

**1.2 මූලික කාර්යයන් සහ මෙහෙයුම් ස්වභාවය**

ප්‍රචාරණය, රූපවාහිනී සහ ගුවන් විදුලි වැඩසටහන් මෙන්ම ඉසව් කළමනාකරණය සැලසිනෙහි මූලික කාර්යයන් අතර ප්‍රධාන තැනක් ගනියි.

**1.3 සේවක ප්‍රමාණය**

2014.12.31 වෙනි දින වනවිට ස්ථිර සේවකයින් 14 ක් සහ කොන්ත්‍රාත් පදනම මත බඳවාගත් සේවකයින් 48 ක් සිට ඇත.

### 2. ගිණුම් ප්‍රතිපත්ති පිළිබඳව සුවිශේෂී කරුණුවල සංක්ෂිප්තය

**2.1 පොදු ප්‍රතිපත්ති**

මෙම මූල්‍ය ප්‍රකාශනයක් සකස් කර ඇත්තේ පොදුවේ පිළිගත් ගිණුම් ප්‍රතිපත්ති සහ ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයේ මඟ පෙන්වීම යටතේ පවත්නා ශ්‍රී ලංකා ගිණුම් ප්‍රතිපත්තිවලට අනුකූලව ය. දැනට පවත්නා පදනම සැලකීමට භාජනය කර ශ්‍රී ලංකා රුපියල්වලින් මූල්‍ය ප්‍රකාශය ඉදිරිපත් කර ඇත.

**2.2 ස්ථායීතාවය සහ සැසැඳුම්**

මෙම වසර සඳහා යොදා ගන්නා ලද ගිණුම් ප්‍රතිපත්ති පසුගිය වසරේ දී යොදා ගත් ප්‍රතිපත්ති සමඟ අනුකූල වේ.

**2.3 ණය පිරිවැය**

මෙහි ණය පිරිවැය හඳුනාගෙන ඇත්තේ අදාළ ගිණුම් කාලය තුළ දරන ලද වියදම් ලෙස ය.

### 3. වත්කම් තක්සේරුව සහ එහි අගැයුම් පදනම

**3.1 දේපල, පිරියත සහ උපකරණ**

පිරිවැය හෝ ප්‍රත්‍යාගණනය මත දේපල, පිරියත සහ උපකරණ පිළිබඳ වාර්තා සකස් කර ඇත.

**3.2 වෙළෙඳ හා ලැබිය යුතු වෙනත් දෑ**

වෙළෙඳ හා ලැබිය යුතු වෙනත් දෑ ඇස්තමේන්තු කළ උපලබ්ධි අගය මත සඳහන් කර ඇත.

**3.3 වෙළෙඳ හා අනෙකුත් ගෙවීම්**

මූල්‍ය ප්‍රකාශනයේ දැක්වෙන පරිදි 2011 වර්ෂයේ සිට අද දක්වා නොගෙවනු ලැබූ බදු මුදල් ස්ථිර තැන්පත් හි තැන්පත් කර ඇත. සමාගම් පනත යටතේ සැලසිනෙ සංස්ථාපිතයන්ට අනුව අදාළ කාලපරිච්ඡේදයට අදාළව මුළු මුදල ගෙවා ඇති 2011 වර්ෂයට පෙර වර්ෂයන් සඳහා දේශීය ආදායම් වෙතින් ණය සහන ඉල්ලා සිටීමේ සාකච්ඡා දැනට පැවැත්වේ.

**3.4 මුදල් සහ මුදල් සමාන දෑ**

මුදල් සහ මුදල් සමාන දෑ සඳහා අතැති මුදල් සහ බැංකුවල ඇති ඉල්ලුම් තැන්පතු ඇතුළත් වේ.

**3.5 කල්බදු වත්කම්**

කල්බදු පිළිබඳ නියමයන් හි දී අයිතිය දැක්වෙන සියලු අවදානම් සහ පාරිතෝෂිකයන් මූල්‍ය කල්බදු ලෙස වර්ගීකරණය කිරීම සැලසිනෙ උපකල්පනය කරයි. කල්බදු පිළිබඳ මූලික හඳුන්වාදීමේ දී එහි අවම කල්බදු ගෙවීමේ දී එහි සාධාරණ අගයේ සහ වර්තමාන අගයන්ට වඩා අඩු සමානත්වයක් ගණනය කිරීමේ දී සිදුවේ. මූලික හැඳින්වීමෙන් අනතුරුව වත්කම් සඳහා යොදා තිබෙන ගිණුම් ප්‍රතිපත්තීන්ට අනුකූලව වත්කම් ගණනය කරනු ලැබීය.

**3.6 ක්ෂය කිරීම්**

ආදායම් ප්‍රකාශය තුළ ක්ෂය වීම් ලෙස හඳුන්වනු ලැබුණේ ප්‍රයෝජනයට ගත හැකි යැයි ඇස්තමේන්තු ගතකර තිබෙන වත්කම් පදනම් කරගත් සරල මාර්ග ක්‍රමය යොදා ගනිමිනි. මූල්‍ය කල්බදු යටතේ පවතින කෙටිකාලීන හා ප්‍රයෝජනයට ගත හැකි සමාන වටිනාකම් සහිත වත්කම් මත ක්ෂය කිරීම් සිදුකර ඇත.

දේපල, පිරියත හා උපකරණ අයිතමයන්ගේ ක්ෂය අනුපාතයන් පහත දැක්වේ.

| | |
|---|---|
| ලී බඩු හා සවිකිරීම් | වර්ෂ 2 - 10 |
| පරිගණක උපාංග | වර්ෂ 3 - 5 |
| කාර්යාලීය උපකරණ | වර්ෂ 10 |
| මෝටර් වාහන | වර්ෂ 05 |
| කැමරා උපකරණ | වර්ෂ 10 |
| ගිණුම්කරණ මෘදුකාංග | වර්ෂ 10 |

## 4. වගකීම් හා ප්‍රතිපාදන

**4.1** ශේෂ පත්‍ර දින සිට වසරක කාලයක් තුළ ඉල්ලුම මත ගෙවීමට ඇති ජංගම වගකීම් ශේෂ පත්‍රයෙහි වගකීම් ලෙස වර්ගීකරණය කර ඇත. ශේෂ පත්‍ර දින සිට වසරක කාලයකට පසුව ගෙවීමට නියමිත වගකීම් දීර්ඝ කාලීන වගකීම් ලෙස වර්ගීකරණය කර ඇත.

### 4.2 විශ්‍රාම හා පාරිතෝෂික දීමනා

සේවක ප්‍රතිලාභ - SLAS 16 (සංශෝධිත 2006) විධිවිධානයන් යටතේ සියලු සේවකයන්ගේ විශ්‍රාමික ප්‍රතිලාභ සේවයේ පළමු වසරේ සිටම ප්‍රතිපාදනය කර ඇත.

1983 අංක 12 දරන පාරිතෝෂික දීමනා පනතට අනුකූලව ඒ යටතේ වසර 05 ක් එක දිගට පවත්වාගෙන ගොස් සේවය අවසන් කරන්නා වූ සේවකයින් සඳහා වන වගකීමක් ලෙස ප්‍රතිපාදන වෙන්කර ඇත.

### 4.3 අර්ථ දැක්වූ දායකත්ව සැලසුම් - සේවක අර්ථ සාධක අරමුදල සහ සේවක භාරකාර අරමුදල

සේවය අවසන් කළ සේවකයන් සඳහා ප්‍රතිලාභ සැලසුමක් ලෙස යම්කිසි අයතනයක් මගින් තවත් ආයතනයකට ගෙවන්නා වූ ස්ථිර දායකත්වයක් හැර තවදුරටත් වෙනත් ගෙවීමක් කිරීමට නෛතික හෝ අර්ථකාරී බැඳීමක් නොමැති සේවක ප්‍රතිලාභ සැලසුමක් අර්ථ දැක්වූ දායකත්ව සැලසුමක් වේ. සියලුම සේවකයින් ආවරණය කරන පරිදි අර්ථසාධක හා භාරකාර අරමුදල් සඳහා දායකත්වය සැලසීමට ඇති බැඳීමකින් කරන ගෙවීම් ලාභාලාභ ගිණුම සඳහා වියදමක් ලෙස එය කරන්නා වූ අවස්ථාවේදී ම හඳුන්වනු ලැබේ. සේවක අර්ථසාධක අරමුදල සහ සේවක භාරකාර අරමුදල සඳහා අදාළ නීති හා රෙගුලාසිවලට අනුකූලව සේවායෝජකයාගේ දායකත්වය ලැබීමට සේවකයින් සුදුසුකම් ලබයි.

සේවක දල වැටුපෙන් 15%ක් හා 3%ක් පිළිවෙලින් සේවක අර්ථසාධක අරමුදලට හා සේවක භාරකාර අරමුදල් වෙත සැලසිනෙ දායකත්වය ලබාදෙයි.

## 5. ආදායම් ප්‍රකාශය

### 5.1 පිරිවැටුම

සැලසිනෙහි පිරිවැටුම ග්‍රැෆික් චිත්‍ර නිර්මාණ, උපලේඛනගත කිරීම්, ඉසව් කළමනාකරණය සහ රූපවාහිනී සහ ගුවන් විදුලි වැඩසටහන් නිෂ්පාදනය තුළින් ලැබේ.

### 5.2 ආදායම් හඳුනා ගැනීම

ආර්ථික ප්‍රතිලාභ ආයතනය තුළට ගලා එන බවට සහ ඒ තුළින් විශ්වාසීව ස්ථිර ලෙස ආදායම් ගණනය කළ හැකි ලෙස ආදායම් ඉපැයීම අදායම් ලෙස හඳුනා ගැනේ.

### 5.3 වියදම් හඳුනා ගැනීම

ආදායම් ප්‍රකාශනයෙහි වියදම් හඳුනාගෙන ඇත්තේ දරන ලද පිරිවැය සහ විශේෂිත වූ ආදායම් අයිතමයන්හි ඉපැයීම් අතර ඍජු සම්බන්ධතාවයෙහි පදනම මතය.

## 6. අදාළ පාර්ශ්ව අතර ගනුදෙනු

ගිණුම් ප්‍රකාශනයෙහි සඳහන් කාලය තුළ අදාළ පාර්ශ්ව අතර ගනුදෙනු කිසිවක් සිදුකර නොමැත.

## 7. ශේෂ පත්‍රයට පසු ගැළපුම් සටහන්

මූල්‍ය වාර්තාවෙහි හෙලිදරව් කළ යුතු හෝ ගැළපීම් කළ යුතු ප්‍රමාණාත්මක සිදුවීම් ශේෂ පත්‍ර දිනට පසු සිදු වී නොමැත.

**8.** ශ්‍රී ලංකා මහ බැංකුවේ උපදෙස් පරිදි ප්‍රමුඛ බැංකුවේ පැවති රු. 300,000.00 ක තැන්පතුව, ශ්‍රී ලංකා ඉතිරි කිරීමේ ගිණුමට මාරුකර ඇත.

**9.** ණයගැතියන් සඳහා අඩමාණ ණය ලෙස 2.5% ක් වෙන්කර තිබේ. එයට අමතරව හඳුනාගත නොහැකි ණයගැතියන් වෙනුවෙන් සම්පූර්ණ මුදල සඳහා අඩමාණ ණය වෙන්කිරීම සිදුකර ඇත.

# ආදායම් ප්‍රකාශය

## 2014 දෙසැම්බර් මස 31 වෙනි දිනෙන් අවසන් වූ වසර සඳහා

ශ්‍රී ලංකා මුදලින් දක්වන ලදී

| | සටහන් | 2014 | 2013 | 2012 |
|---|---|---|---|---|
| | | රු. | රු. | රු. |
| ආදායම් | 11 | 450,068,680.36 | 653,144,763.00 | 437,939,421.00 |
| අඩු කළා : | | | | |
| සෘජු පිරිවැය | 12 | 403,588,539.17 | 600,839,302.00 | 372,938,887.00 |
| දළ ලාභය | | 46,480,141.19 | 52,305,461.00 | 65,000,534.00 |
| වෙනත් මෙහෙයුම් ආදායම් | 13 | 5,482,485.88 | 4,932,810.00 | 810,873.00 |
| | | 51,962,627.07 | 57,238,271.00 | 65,811,407.00 |
| අඩු කළා : පරිපාලන වියදම් | 14 | 49,072,706.67 | 37,282,389.37 | - |
| බෙදාහැරීමේ වියදම් | 15 | 2,904,277.17 | 4,078,808.00 | 26,169,495.00 |
| මෙහෙයුම් ක්‍රියාකාරකම් මත ලාභාලාභය | | (14,356.77) | 15,877,073.63 | 32,249,640.00 |
| අඩු කළා : මූල්‍ය වියදම් | 16 | 269,073.78 | 642,617.35 | 1,208,428.00 |
| වෙනත් වියදම් | 17 | 403,516.67 | 2,023,714.65 | 1,449,410.00 |
| ශුද්ධ ලාභය/ (අලාභය) බදු පෙර | | (686,947.22) | 13,210,741.63 | 29,591,802.00 |
| ශුද්ධ ලාභය/ (අලාභය) බදු පසු | | (686,947.22) | 13,210,741.63 | 29,591,802.00 |
| වර්ෂය සඳහා ශුද්ධ ලාභය/ (අලාභය) | | **(686,947.22)** | **13,210,741.63** | **29,591,802.00** |

## 2014 දෙසැම්බර් මස 31 වෙනි දිනට

ශ්‍රී ලංකා මුදලින් දක්වන ලදී

| | සටහන් | 2014 | 2013 | 2012 |
|---|---|---|---|---|
| | | රු. | රු. | රු. |
| **වත්කම්** | | | | |
| **ජංගම නොවන වත්කම්** | | | | |
| දේපල, පිරියත හා උපකරණ | 18 | 20,900,866.22 | 19,985,876.00 | 20,144,197.00 |
| ගොඩනැගිලි කුලී | | 9,210,310.22 | - | - |
| | | 30,111,176.44 | 19,985,876.00 | 20,144,197.00 |
| ස්ථාවර තැන්පතු | 19 | 78,411,550.41 | 62,713,488.00 | 20,800,000.00 |
| | | 108,522,726.85 | 82,699,364.00 | 40,944,197.00 |
| **ජංගම වත්කම්** | | | | |
| වෙළෙඳ හා ලැ/යු වෙනත් වත්කම් | 20 | 211,844,899.05 | 311,839,772.00 | 131,503,883.00 |
| තැන්පතු සහ පෙර ගෙවුම් | 21 | 65,000.00 | 65,000.00 | 100,000.00 |
| මුදල් සහ මුදල් සමාන දෑ | 22 | 14,848,009.71 | 25,606,496.00 | 45,554,440.00 |
| | | 226,757,908.76 | 337,511,268.00 | 177,158,323.00 |
| **මුළු වත්කම්** | | **335,280,635.61** | **420,210,632.00** | **218,102,520.00** |
| **ස්කන්ධය සහ වගකීම්** | | | | |
| ප්‍රාග්ධනය සහ සංචිත | | | | |
| සමුච්චිත ලාභය/ (අලාභය) | | 82,161,325.48 | 35,066,159.00 | 26,194,953.00 |
| | | 82,161,325.48 | 35,066,159.00 | 26,194,953.00 |
| **ජංගම නොවන වගකීම්** | | | | |
| රාජ්‍ය ආයතන සැපයූ අරමුදල් | | | | |
| උපචිත පාරිතෝෂික දීමනා | 23 | 5,490,466.65 | 4,430,647.00 | 4,053,061.00 |
| කල්බදු ණය | | - | 6,786.00 | 1,375,041.00 |
| මහා භාණ්ඩාගාර ණය | | 3,720,000.00 | 5,580,000.00 | 9,300,000.00 |
| | | 9,210,466.65 | 10,017,433.00 | 14,728,102.00 |
| **ජංගම වගකීම්** | | | | |
| ගෙ/යු කල්බදු ණය පොලී | 24 | 686,596.63 | - | - |
| වෙළෙඳ හා ගෙ/යු වෙනත් විදයම් | 25 | 240,606,949.21 | 372,531,547.00 | 177,053,214.00 |
| මහා භාණ්ඩාගාර ණය | | 1,860,000.00 | 129,552.00 | 126,252.00 |
| අත්තිකාරම් ලැබීම් | | 755,296.00 | 1,860,000.00 | - |
| **මුළු වගකීම්** | | 243,908,841.84 | 374,521,099.00 | 177,179,466.00 |
| **මුළු ස්කන්ධය සහ වගකීම්** | | **335,280,633.97** | **420,210,631.00** | **218,102,521.00** |

මෙම මූල්‍ය ප්‍රකාශ ශ්‍රී ලංකා රාජ්‍ය ගිණුම් ප්‍රමිත හා ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය විසින් හා 1971 අංක 31 දරන මූල්‍ය පනතේ නියමයන්ට අනුව සකස් කර ඇත.

සත්‍ය බවට අධ්‍යක්ෂකවරුන් විසින් සහතික කරන ලදී.

අත්සන් කළේ,

**සභාපති**
සැලසිනෙ රූපවාහිනී ආයතනය

# මුදල් ප්‍රවාහ ප්‍රකාශනය

**2014 දෙසැම්බර් මස 31 වෙනි දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා**

ශ්‍රී ලංකා මුදලින් දක්වන ලදී

| | 2014 | 2013 |
|---|---|---|
| | රු. | රු. |
| **මෙහෙයුම් කටයුතුවලින් මුදල් ප්‍රවාහයන්** | | |
| ආදායම් බද්දට පෙර ශුද්ධ ලාභය | (686,947.22) | 13,210,740.00 |
| **ගැලපීම් :** | | |
| පොලී වියදම් | 170,566.58 | 175,005.00 |
| පොලී ආදායම් | (3,944,376.12) | (4,757,611.00) |
| දේපල පිරියත හා උපකරණ මත ක්ෂය වෙන් කිරීම් | 4,348,682.00 | 3,655,509.00 |
| පාරිතෝෂික සඳහා වෙන්කිරීම් | 1,130,377.29 | 599,328.00 |
| සමුච්චිත අරමුදලට පසුගිය වර්ෂය සඳහා ගැලපීම් | 47,782,113.70 | (4,339,534.00) |
| දේපල පිරියත හා උපකරණ ඉවත් කිරීමේ අලාභය | - | (24,822.00) |
| **කාරක ප්‍රාග්ධන වෙනස්කම්වලට පෙර මෙහෙයුම් ලාභය** | 48,800,416.23 | 8,518,615.00 |
| වෙළෙඳ සහ අනෙකුත් ලැබීම් (වැඩිවීම්/ අඩුවීම්) | 99,944,772.95 | (180,335,889.00) |
| තැන්පත් සහ කලින් කළ ගෙවීම් (වැඩිවීම්/ අඩුවීම්) | - | 35,000.00 |
| ගොඩනැගිලි වියදම් සඳහා වෙන්කිරීම් (වැඩිවීම්/ අඩුවීම්) | (9,210,310.22) | - |
| වෙළෙඳ සහ අනෙකුත් ගෙවීම් (වැඩිවීම්/ අඩුවීම්) | 131,924,596.79 | 195,478,334.00 |
| ලද අත්තිකාරම් (වැඩිවීම්/ අඩුවීම්) | 625,744.00 | 3,300.00 |
| **මෙහෙයුම් කටයුතුවලින් ජනනය වූ මුදල්** | 8,286,129.81 | 23,699,359.00 |
| පාරිතෝෂිත ගෙවීම් | (70,557.68) | (221,742.00) |
| පොලී ගෙවීම් | - | (175,005.00) |
| දේපල පිරියත හා උපකරණ මිලට ගැනීම් | (5,263,673.22) | (3,998,559.00) |
| දේපල පිරියත හා උපකරණ ඉවත් කිරීමෙන් ලද මුදල් | - | 526,195.00 |
| ස්ථාවර තැන්පතුවල ආයෝජනය | (15,698,072.41) | (41,913,488.00) |
| පොලී ආදායම් | 3,944,376.12 | 4,757,611.00 |
| **මෙහෙයුම් ක්‍රියාවලියේ ශුද්ධ මුදල් ප්‍රවාහය** | **17,017,361.05** | **(40,628,241.00)** |
| **මූල්‍ය ක්‍රියාවලියේ ශුද්ධ මුදල් ප්‍රවාහය** | | |
| භාණ්ඩාගාර ණය ලැබීම්/ (ගෙවීම්) | (1,860,000.00) | (1,860,000.00) |
| ණය නැවත ගෙවීම් | (528,675.97) | (762,314.00) |
| වැරදි නිවැරදි කිරීම් (කල්බදු) | 431,978.56 | - |
| **මූල්‍ය ක්‍රියාවලියේ ශුද්ධ මුදල් ප්‍රවාහය** | **(1,956,697.41)** | **(2,622,314.00)** |
| **මුදල් හා ද්‍රවශීලතාවයේ ශුද්ධ වැඩිවීම / අඩුවීම** | **(10,758,486.29)** | **(19,947,944.00)** |
| **වර්ෂය ආරම්භයේ මුදල් හා ද්‍රවශීලතාවය (සටහන A)** | **25,606,496.00** | **45,554,440.00** |
| **වර්ෂය අවසානයේ මුදල් හා ද්‍රවශීලතාවය (සටහන A)** | **14,848,009.71** | **25,606,496.00** |
| **(සටහන A) මුදල් හා මුදල් සමාන දෑ** | | |
| ලංකා බැංකුව - ජංගම ගිණුම (2323299) | 7,311,326.85 | 18,599,600.00 |
| ලංකා බැංකුව - ඉතුරුම් ගිණුම (2329765) | 6,988,582.86 | 6,736,471.00 |
| නිෂ්පාදන අත්තිකාරම් | 373,100.00 | 135,425.00 |
| වෙනත් අත්තිකාරම් | 175,000.00 | 135,000.00 |
| | **14,848,009.71** | **25,606,496.00** |

## මූල්‍ය වාර්තා සඳහා සටහන්

2014 දෙසැම්බර් මස 31 වෙනි දිනෙන් අවසන් වූ වසර සඳහා

ශ්‍රී ලංකා මුදලින් දක්වන ලදී

| | 2014 | 2013 | 2012 |
|---|---|---|---|
| | රු. | රු. | රු. |
| **11. සේවා සැපයීමෙන් ලබන ආදායම්** | | | |
| නිෂ්පාදන | 39,809,755.67 | 40,541,319.00 | 27,611,388.00 |
| ග්‍රැෆික් | 24,569,248.77 | 27,525,225.00 | 38,617,520.00 |
| උපලේඛනගත කිරීම් | 334,587,225.95 | 307,668,222.00 | 328,408,933.00 |
| ඉසව් | - | - | - |
| වෙනත් | 103,028,945.78 | 277,409,997.00 | 43,301,580.00 |
| අඩු කළා : ආදායම මත අලෙවි බද්ද | (51,926,495.81) | - | - |
| | 450,068,680.36 | 653,144,763.00 | 437,939,421.00 |
| **12. සෘජු පිරිවැය** | | | |
| නිෂ්පාදන වියදම් | 26,091,223.36 | 35,610,274.00 | 14,015,088.00 |
| ග්‍රැෆික් වියදම් | 18,524,177.70 | 23,771,275.00 | 31,884,512.00 |
| උපලේඛනගත වියදම් | 275,960,848.63 | 277,726,680.00 | 286,912,288.00 |
| ඉසව් | - | - | - |
| වෙනත් වියදම් | 118,290,681.55 | 263,586,163.00 | 40,126,999.00 |
| ''ඇමතුම් මධ්‍යස්ථාන'' ව්‍යාපෘතිය | - | 114,910.00 | 40,000.00 |
| අඩු කළා : ආදායම මත අලෙවි බද්ද | (35,278,392.07) | - | - |
| | 403,588,539.17 | 600,839,302.00 | 372,978,887.00 |
| **13. වෙනත් මෙහෙයුම් ආදායම්** | | | |
| සේවක ණය පොලී | 92,230.84 | 65,835.00 | 34,612.00 |
| බැංකු පොලී | 3,944,376.12 | 4,757,611.00 | 683,273.00 |
| වෙනත් පොලී | 572,467.20 | 42,542.00 | 24,988.00 |
| සැපයුම්කරුවන් ලියාපදිංචිය | 873,411.72 | 42,000.00 | 28,000.00 |
| නිර්මාණ ගාස්තු | - | - | - |
| ප්‍රවාහන ගාස්තු | - | - | - |
| | - | 24,822.00 | - |
| | 5,482,485.88 | 4,932,810.00 | 770,873.00 |
| **14. පරිපාලන වියදම්** | | | |
| වැටුප් හා වේතන | 18,143,731.32 | 16,619,293.80 | 14,499,759.00 |
| සේවක අර්ථසාධක අරමුදල | 1,729,198.60 | 1,562,712.80 | 1,422,470.00 |
| සේවක භාරකාර අරමුදල | 345,839.96 | 310,347.54 | 284,264.00 |
| සේවක අතිකාල සහ යැපීම් දීමනා | 2,189,593.59 | 1,596,083.63 | 835,764.00 |
| දුරකථන ගාස්තු | 498,026.48 | 541,853.97 | 432,285.00 |
| සේවක සුභසාධනය | 1,873,981.52 | 2,222,640.00 | 1,369,735.00 |
| තැපැල් | 43,135.00 | 23,271.00 | 34,101.00 |
| මුද්‍රණ හා ලිපි ද්‍රව්‍ය | 1,310,442.60 | 1,120,647.00 | 1,413,498.00 |
| විගණන ගාස්තු | 250,000.00 | 30,000.00 | - |
| පුහුණු කිරීමේ වැඩසටහන් | 41,500.00 | 770,710.00 | 657,078.00 |
| වාහන කුලී | 585,000.00 | 780,000.00 | 1,185,000.00 |
| විදුලිය | 290,032.73 | 108,528.24 | 418,502.00 |
| ප්‍රසාද දීමනා | 720,687.00 | 542,500.00 | 669,249.00 |
| පාරිතෝෂික දීමනා | 1,130,377.29 | 599,327.67 | 745,953.00 |
| අධ්‍යක්ෂ වේතන | 676,275.00 | 650,000.00 | 600,000.00 |
| ජලය | 92,331,76 | 61,435.20 | 119,926.00 |
| ලියාපදිංචි ගාස්තු | 16,413,60 | 43,570.00 | 73,589.00 |
| අලුත්වැඩියා හා නඩත්තු - කාර්යාලීය උප. | 1,094,668.00 | 1,210,447.97 | 481,565.00 |
| අලුත්වැඩියා හා නඩත්තු - නිෂ්. උපකරණ | 335,866.80 | 495,543.00 | 226,229.00 |
| පුවත්පත් වියදම් | 70,370.60 | 128,705.00 | 40,965.00 |
| ආගමික සහ සංස්කෘතික වියදම් | - | 29,757.75 | 115,780.00 |
| සාමාජීය සුභසාධන | 295,146.86 | 283,000.00 | 212,853.00 |

ශ්‍රී ලංකා මුදලින් දක්වන ලදී

| | 2014 | 2013 | 2012 |
|---|---|---|---|
| | රු. | රු. | රු. |
| ගොඩනැගිලි වියදම් | 2,302,577.55 | 1,367,500.00 | 17,562.00 |
| වෘත්තීය ගාස්තු | 407,875.00 | 682,500.00 | 195,000.00 |
| උපදේශක ගාස්තු | 15,000.00 | - | - |
| ආරක්ෂක සේවා වියදම් | 657,600.00 | - | - |
| ටෙන්ඩර් ගාස්තු | 2,500.00 | 20,500.00 | 17,500.00 |
| පරිවර්තන ගාස්තු | 37,200.00 | 253,300.00 | 98,070.00 |
| කාර්යාලීය උපකරණ - අලාභය | - | 1,024,447.10 | 2,800.00 |
| සේවක රක්ෂණ | 2,105,263.72 | 74,500.00 | - |
| වෙබ් අඩවි යාවත්කාලීන කිරීමේ වියදම් | 5,850.00 | 300,848.50 | - |
| අන්තර්ජාල වියදම | 253,449.27 | 110,000.00 | - |
| විදේශ ගමන් වියදම් | 1,103,121.00 | 1,103,121.00 | - |
| අධ්‍යක්ෂක මණ්ඩල දීමනා | 247,500.00 | 247,500.00 | - |
| නවාතැන් | 138,340.00 | - | - |
| වෙළෙඳ දැන්වීම් | - | 241,600.00 | - |
| ගොඩනැගිලි කුලී වියදම් | 3,150,000.00 | - | - |
| පිරිසිදු කිරීමේ වියදම් | 62,320.00 | - | - |
| පරිගණක අලුත්වැඩියා වියදම් | 27,450.00 | - | - |
| ආධාර | 165,000.00 | - | - |
| ආහාර වියදම් | 127,500.00 | - | - |
| සාද | 252,000.00 | - | - |
| තෑගි වියදම් | 267,000.00 | - | - |
| ටී ෂර්ට් | 49,720.00 | - | - |
| කාර්යාල වියදම් | 943,164.38 | - | - |
| ක්ෂය වීම් | 247,500.00 | 110,000.00 | - |
| බොල් ණය | 1,436,924.31 | 1,362,910.00 | - |
| | **49,072,706.67** | **37,282,389.37** | **26,169,495.00** |

**15. විකුණුම් හා බෙදාහැරීමේ වියදම්**

| | 2014 | 2013 | 2012 |
|---|---|---|---|
| ඉන්ධන | 1,196,220.65 | 1,464,716.00 | 1,229,499.00 |
| මෝටර් රථ අලුත්වැඩියා සහ නඩත්තු | 595,944.54 | 855,201.00 | 560,742.00 |
| ප්‍රවාහන,ගමන් ගාස්තු සහ නවතා තැබීම් | 582,242.07 | 193,536.00 | 82,184.00 |
| අලෙවි ප්‍රවර්ධන වියදම් | 66,500.00 | 919,977.00 | 4,610,740.00 |
| අලෙවි දිරි දීමනා | 251,262.41 | 645,377.00 | 894,170.00 |
| රක්ෂණ - අලාභය | 212,107.50 | - | 14,938.00 |
| | **2,904,277.17** | **4,078,808.00** | **7,392,272.00** |

**16. මූල්‍ය පිරිවැය**

| | 2014 | 2013 | 2012 |
|---|---|---|---|
| බැංකු ගාස්තු | 98,507.20 | 224,561.73 | 37,955.00 |
| බලපත්‍ර හා රක්ෂණ ගාස්තු | - | 243,050.38 | 826,976.00 |
| කල්බදු පොලී | 170,566.58 | 175,005.24 | 343,497.00 |
| | **269,073.78** | **642,617.35** | **1,208,428.00** |

**17. වෙනත් වියදම්**

| | 2014 | 2013 | 2012 |
|---|---|---|---|
| විවිධ වියදම් | 163,516.67 | - | 515,278.00 |
| නෛතික වියදම් | 240,000.00 | 198,000.00 | 429,475.00 |
| වෙනත් වියදම් | - | 1,806,789.65 | 504,657.00 |
| අධිභාර වියදම් | - | 18,925.00 | - |
| | **403,516.67** | **2,023,714.65** | **1,449,410.00** |

**18. ක්ෂය වීම්**

| | 2014 | 2013 | 2012 |
|---|---|---|---|
| ලී බඩු සහ සවිකිරීම් | 161,512.00 | 100,235.00 | 124,558.00 |
| පරිගණක උපාංග | 735,979.00 | 465,483.00 | 311,625.00 |
| කාර්යාල උපකරණ | 245,797.00 | 113,900.00 | 199,433.00 |
| මෝටර් රථ | 1,567,165.00 | 1,098,698.00 | 1,102,802.00 |
| කැමරා සහ උපකරණ | 1,173,779.00 | 1,684,734.00 | 46,160.00 |
| ගිණුම්කරණ මෘදුකාංග | 209,134.00 | 192,459.00 | 150,000.00 |
| ජාල පද්ධතිය | 255,316.00 | - | - |
| | **4,348,682.00** | **3,655,509.00** | **1,934,578.00** |

## 2014 දෙසැම්බර් මස 31 වෙනි දිනෙන් අවසන් වූ වසර සඳහා

### 18. දේපල පිරියත හා උපකරණ

| 18.1 (අ) | 01.01.2014 දිනට පිරිවැය | එකතු කිරීම් | ඉවත් කිරීම් | 31.12.2014 දිනට පිරිවැය |
|---|---|---|---|---|
| ලී බඩු සහ සවිකිරීම | 1,676,879.00 | 636,749.50 | - | 2,313,628.50 |
| පරිගණක උපාංග | 4,966,952.00 | 826,067.00 | - | 5,793,019.00 |
| කාර්යයාලීය උපකරණ | 2,771,987.00 | 306,206.00 | - | 3,078,193.00 |
| මෝටර් වාහන | 9,080,824.00 | - | - | 9,080,824.00 |
| කැමරා සහ උපකරණ | 14,512,900.00 | - | - | 14,512,900.00 |
| ගිණුම්කරණ මෘදුකාංග | 2,060,000.00 | 75,000.00 | - | 2,135,000.00 |
| ජාලකරණ මෙහෙයුම් | - | 3,419,650.72 | - | 3,419,650.72 |
| | 35,069,542.00 | 5,263,673.22 | - | 40,333,215.22 |
| **18.2 (ආ) ක්ෂය වීම්** | | | | |
| ලී බඩු සහ සවිකිරීම | 1,018,042.00 | 161,512.00 | - | 1,179,554.00 |
| පරිගණක උපාංග | 3,020,148.00 | 735,979.00 | - | 3,756,126.00 |
| කාර්යයාලීය උපකරණ | 1,699,068.00 | 245,797.00 | - | 1,944,865.00 |
| මෝටර් වාහන | 4,047,928.00 | 1,567,165.00 | - | 5,615,093.00 |
| කැමරා සහ උපකරණ | 4,806,022.00 | 1,173,779.00 | - | 5,979,801.00 |
| ගිණුම්කරණ මෘදුකාංග | 492,459.00 | 209,134.00 | - | 701,593.00 |
| ජාලකරණ මෙහෙයුම් | - | 255,316.00 | - | 255,316.00 |
| | 15,083,667.00 | 4,348,682.00 | - | 19,432,349.00 |
| **ශුද්ධ පොත් අගය** | 19,985,875.00 | | | 20,900,866.22 |

| | | 2014 | 2013 | 2012 |
|---|---|---|---|---|
| | | රු. | රු. | රු. |
| **19. ස්ථාවර තැන්පතු** | | | | |
| ලංකා බැංකුව - ගිණුම් අංක 742656 | | 500,000.00 | 500,000.00 | 500,000.00 |
| ලංකා බැංකුව - ගිණුම් අංක 73404 | | 10,000,000.00 | 10,000,000.00 | 10,000,000.00 |
| ලංකා බැංකුව - ගිණුම් අංක 73405 | | 12,306,821.41 | 11,706,959.00 | 10,000,000.00 |
| ප්‍රමුඛ බැංකුව - 103009002920 (ශ්‍රී ලංකා ඉතිරි කිරීම) | | - | 300,000.00 | 300,000.00 |
| ලංකා බැංකුව - ගිණුම් අංක 74798 | | 12,135,172.00 | 12,135,172.00 | - |
| ලංකා බැංකුව - ගිණුම් අංක 74401 | | 26,000,000.00 | 26,000,000.00 | - |
| ලංකා බැංකුව - ගිණුම් අංක 75021610 | | 2,071,357.00 | 2,071,357.00 | - |
| ලංකා බැංකුව - ගිණුම් අංක 76055217 | | 15,000,000.00 | - | - |
| ශ්‍රී ලංකා ඉතිරි කිරීමේ බැංකුව | | 398,200.00 | - | - |
| | | 78,411,550.41 | 62,713,488.00 | 20,800,000.00 |
| **20. වෙළෙඳ හා වෙනත් ලැබිය යුතු දෑ** | | | | |
| වෙළෙඳ ණයගැතියෝ | 20.1 | 180,923,769.64 | 295,705,548.00 | 118,166,373.00 |
| උත්සව අත්තිකාරම් | | 141,500.00 | 144,000.00 | 75,000.00 |
| සේවක ණය | | 1,959,742.00 | 1,947,144.00 | 945,130.00 |
| වැටුප් අත්තිකාරම් | | 21,000.00 | 5,000.00 | - |
| රඳවා ගැනීමේ බදු | | 4,556,283.00 | 4,556,283.00 | 4,556,283.00 |
| ආර්ථික සේවා ගාස්තු | | 3,599,744.00 | 3,913,602.00 | 3,913,602.00 |
| උපාලි පුවත්පත් | | 10,695.00 | 10,695.00 | 10,695.00 |
| සීමාසහිත එක්සත් පුවත්පත් සමාගම | | 2,500,181.00 | 2,500,181.00 | 3,528,092.00 |
| විජය පුවත්පත් | | 172,245.00 | 172,245.00 | 172,245.00 |
| ඊ ඒ පී ආයතනය | | 3,004.00 | 3,004.00 | 3,004.00 |
| ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාව - කොමිස් | | 63,558.00 | 63,558.00 | - |
| ආපසු ලැබිය යුතු තැන්පතු | | 200,000.00 | 100,000.00 | 100,000.00 |
| සෙලින්කෝ රක්ෂණ ආයතනය | | 62,050.00 | 62,050.00 | 33,458.00 |
| ලැබිය යුතු බැංකු පොලී ආදායම | | 5,643,127.41 | 2,656,462.00 | - |
| මූල්‍ය වංචාව වෙනුවෙන් අයවිය යුතු මුදල | 20.2 | 11,988,000.00 | - | - |
| | | 211,844,899.05 | 311,839,772.00 | 131,503,883.00 |
| **20.1 වෙළෙඳ ණයගැතියෝ** | | | | |
| වෙළෙඳ ණයගැතියෝ 2014 දක්වා | | 188,505,962.64 | 303,287,741.00 | 124,385,656.00 |
| අඩුකළා : | | | | |
| බොල් ණය සඳහා වෙන්කිරීම් | | 7,582,193.00 | 7,582,193.00 | 6,219,283.00 |
| | | 180,923,769.64 | 295,705,548.00 | 118,166,373.00 |

**20.2 මුදල් වංචාව**

නිසි අධිකාරියෙන් තොරව ආයතනයේ සේවකයින් විසින් ආයතනයේ මුදල් ලබාගැනීම පිළිබඳව පරීක්ෂණ කටයුතු මූල්‍ය අපරාධ විමර්ශන ඒකකය විසින් සිදුකරනු ලබන අතර, මෙම මුදල් ආපසු ලබාගැනීම සඳහා පරීක්ෂණ කටයුතු සිදුකරනු ලැබේ.

| | 2014 | 2013 | 2012 |
|---|---|---|---|
| **21. තැන්පතු සහ පෙර ගෙවුම්** | | | |
| පෙර ගෙවුම් වාහන කුලී | 65,000.00 | 65,000.00 | - |
| බැංකු ඇපකර | - | - | 100,000.00 |
| | 65,000.00 | 65,000.00 | 100,000.00 |
| **22. මුදල් සහ මුදල් සමාන දෑ** | | | |
| ලංකා බැංකු ගිණුම - 2323299 | 7,311,326.85 | 18,599,600.00 | 18,892,885.00 |
| ලංකා බැංකු ඉතුරුම් ගිණුම - 2329765 | 6,988,582.86 | 6,736,471.00 | 26,661,555.00 |
| නිෂ්පාදන අත්තිකාරම් | 373,100.00 | 135,425.00 | - |
| අනෙකුත් අත්තිකාරම් | 175,000.00 | 135,000.00 | - |
| | 14,848,009.71 | 25,606,496.00 | 45,554,440.00 |

ශ්‍රී ලංකා මුදලින් දක්වන ලදී

| | 2014 | 2013 | 2012 |
|---|---|---|---|
| | රු. | රු. | රු. |
| **23. ගෙවිය යුතු පාරිතෝෂික දීමනා** | | | |
| ඉදිරියට ගෙනා ශේෂය | - | - | 3,516,376.00 |
| වර්ෂය සඳහා පාරිතෝෂික වියදම | - | - | 745,953.00 |
| | - | - | 4,262,329.00 |
| අඩු කළා : පාරිතෝෂික ගෙවීම් | - | - | 209,268.00 |
| | - | - | **4,053,061.00** |
| **24. ගෙවිය යුතු ණය පොලී** | | | |
| කල්බදු ණයහිමියෝ | 686,596.63 | - | - |
| | **686,596.63** | - | - |
| **24.1 මූල්‍ය කල්බදු** | 904,567.00 | 1,376,515.00 | 1,548,463.00 |
| මිට්සුබිෂි වෑන් | 431,978.56 | - | - |
| එකතු : වැරදි නිවැරදි කිරීම් | (528,674.51) | (471,948) | (471,948.00) |
| අඩු කළා : නැවත ගෙවීම් | **8,07871.05** | **904,556.00** | **1,376,515.00** |
| **24.2 විලම්භිත පොලී** | 291,841.00 | 446,617.14 | 635,870.52 |
| මිට්සුබිෂි වෑන් | 170,566.58 | 154,776.14 | 189,253.38 |
| අඩු කළා : නැවත ගෙවීම් | **121,274.42** | **291,841.00** | **446,617.14** |

## 2014 දෙසැම්බර් මස 31 වෙනි දිනෙන් අවසන් වූ වසර සඳහා

ශ්‍රී ලංකා මුදලින් දක්වන ලදී

| | 2014 | 2013 | 2012 |
|---|---|---|---|
| | රු. | රු. | රු. |
| **25. වෙළෙඳ සහ වෙනත් ගෙවිය යුතු දෑ** | | | |
| වෙළෙඳ ණයහිමියෝ | 142,712,254.00 | 258,071,312.00 | 106,431,355.00 |
| සේවක අර්ථසාධක අරමුදල | 264,080.26 | 15,439.00 | 6,559.00 |
| සේවක භාරකාර අරමුදල | 29,836.97 | - | - |
| අතිකාල සහ යැපීම් දීමනා | - | 145,275.00 | 41,396.00 |
| සණස සමිතිය | 43,120.00 | 43,120.00 | 43,120.00 |
| දුරකථන වියදම් | 47,302.86 | 17,612.00 | 33,369.00 |
| ජලය | 67,609.26 | - | - |
| විදුලිය | 334,455.73 | 125,423.00 | 637,365.00 |
| අලෙවි දිරි දීමනා | - | 18,826.00 | 386,808.00 |
| එකතු කළ අගය මත බදු | 83,799,396.74 | 94,972,378.00 | 54,974,145.00 |
| ජාතිය ගොඩනැගීමේ බදු | 12,306,863.92 | 16,905,054.00 | 10,730,024.00 |
| ගෙ/යු ගොඩනැගිලි කුලී | 630,000.00 | 900,000.00 | 900,000.00 |
| ආර්ථික සේවා ගාස්තු | - | 313,858.00 | 313,858.00 |
| මෙට්‍රොපොලිටන් කාර්යාලය (වෙනත් ණයහිමි) | 327,498.00 | 327,498.00 | - |
| විගණන ගාස්තුව | 2,880.00 | 60,000.00 | 30,000.00 |
| ඉන්ධන | 41,651.47 | 9,811.00 | 20,351.00 |
| ජනමාධ්‍ය අමාත්‍යා. (කැබ් රථ තක්සේරු කිරීම්) | - | - | 1,550,000.00 |
| බදු ණයහිමියෝ | - | 605,940.00 | - |
| | **240,606,949.21** | **372,531,546.00** | **176,098,350.00** |

## 26. සම්බන්ධිත පාර්ශ්වයන් හෙලිදරව් කිරීම (එස්. එල්. ඒ. එස්. 30)

| නම | තනතුර | සම්බන්ධතා පාර්ශ්ව ගනුදෙනු පිළිබඳ ස්වභාවය | ලිපිනය |
|---|---|---|---|
| 01. තුසිත ජයවර්ධන | සභාපති | නැත | අංක 181<br>ඊස්ට් වෙස්ට්<br>මණ්ඩාවිල |
| 02. උපුල් පල්ලේගංගොඩ | සාමාන්‍යාධිකාරී | නැත | අංක. 240/15<br>කුරුඳුවත්ත පාර<br>බෝකුන්දර<br>පිළියන්දල |

**2014 මුදල් වර්ෂය සඳහා සැලසිනෙ රූපවාහිනී ආයතනය සහ ඉහත දැක්වෙන එක් එක් පුද්ගලයින් සහ ඔවුන්ගේ පවුලේ සාමාජිකයින් සමඟ සම්බන්ධතා පාර්ශ්ව ගනුදෙනු සිදුනොවීය.**

## 27. ගොඩනැගිලි අලුත්වැඩියා වියදම්

ආයතනය විසින් ජාතික චිත්‍රපට සංස්ථාවට අයත් ගොඩනැගිල්ලේ අලුත්වැඩියා කටයුතු කිරීම සඳහා වැය වූ මුදල මූලධන වියදමක් ලෙස බදු කාලසීමාව ඇතුළත වසර 05 ක් තුළ ලියා හැරීමට කටයුතු කරන ලදී.

**2014 දෙසැම්බර් මස 31 වෙනි දිනෙන් අවසන් වූ වසර සඳහා**

**ශ්‍රී ලංකා මුදලින් දක්වන ලදී**

| 28. පෙර වර්ෂයේ ගැලපීම් | 2014<br>රු. | 2013<br>රු. | 2012<br>රු. |
|---|---|---|---|
| විගණන ගාස්තු | - | 30,000.00 | - |
| බැංකු ශේෂය | 60,460.12 | - | - |
| බැංකු පොලී 2014 | - | - | - |
| බැංකු පොලී 2015 (වෙන් කිරීම්) | - | - | - |
| කල්බදු හිමියා | 173,961,44 | - | - |
| එකතු කළ අගය මත බදු | 27,821,085.00 | - | - |
| ජාතිය ගොඩනැගීමේ බදු | 8,338,251.04 | - | - |
| රඳවා ගැනීමේ බදු 2013/2014 | - | - | - |
| ගෙ/යු ගොඩනැගිලි කුලී | 270,000.00 | - | - |
| ණයගැතියෝ | 11,118,356.10 | 5,376,506.00 | 5,742,616.00 |
| පෙර වර්ෂය සඳහා ක්ෂය වීම් | - | 691,157.00 | - |
| ණයහිමියෝ | - | - | - |
| අත්තිකාරම් | - | - | - |
| වාහන කුලී | - | - | - |
| උත්සව අත්තිකාරම් | - | - | 3,500.00 |
| ආපදා ණය | - | 65,000.00 | 6,000.00 |
| | **47,782,113.70** | **6,162,633.00** | **5,776,166.00** |

## 2014 වසරේ මූල්‍ය ක්‍රියාකාරීත්වය පිළිබඳව විගණකාධිපතිතුමන්ගේ මතය

# විගණකාධිපති දෙපාර්තමේන්තුව
# கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்
# AUDITOR GENERAL'S DEPARTMENT

මගේ අංකය / எனது இல. / My No. } ටීඑම්/ඊ/එස්සීටීඅයි/6/14/17 ඔබේ අංකය / உமது இல. / Your No. } දිනය / திகதி / Date } 2016 මාර්තු

සභාපති,

සැලසිනෙ රූපවාහිනී ආයතනය.

**සැලසිනෙ රූපවාහිනී ආයතනයේ 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව විගණකාධිපති වාර්තාව**

---

සැලසිනෙ රූපවාහිනී ආයතනයේ 2014 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීරණ ආදායම් ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය සහ වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. සැලසිනෙ රූපවාහිනී ආයතනයේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

**1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව, . - இல. 306/72, பொல்தூவ வீதி, பத்தரமுல்லை, இலங்கை. - No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka
+94-11-2887028-34 +94-11-2887223 oaggov@sltnet.lk www.auditorgeneral.gov.lk

**1.3 විගණකගේ වගකීම**

උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000 -1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව පවත්වනු ලබන විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ.

**1.4 මතය ව්‍යාචනය සඳහා පදනම**

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු වල ප්‍රතිඵලයක් ලෙස මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ, විස්තීරණ ආදායම් ප්‍රකාශනයේ හා ස්කන්ධ වෙනස්වීමේ ප්‍රකාශනයේ සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ වාර්තාගත වූ හෝ වාර්තාගත නොවූ හෝ විෂයයන් සහ මූලිකාංගවලට අදාලව කවර හෝ ගැලපීම් කිරීමේ අවශ්‍යතාවයක් තිබුණේදැයි තීරණය කිරීමට මට නොහැකිය.

**2. මූල්‍ය ප්‍රකාශන**

**2.1 මතය ව්‍යාචනය**

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු හේතුවෙන් විගණන මතයක් සඳහා පදනමක් සැපයීමට ප්‍රමාණවත් සහ උචිත විගණන සාක්ෂි ලබා ගැනීමට මට නොහැකි විය. ඒ හේතුකොට ගෙන මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මම මතයක් ප්‍රකාශ නොකරමි.

**2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

**2.2.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති**

ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති 01 අනුව උපචිත පදනම මත මූල්‍ය ප්‍රකාශන පිළියෙල කළ යුතු නමුත්, විකුණුම් සම්බන්ධයෙන් උපචිත පදනම අනුගමනය නොකිරීම නිසා ඉකුත් වර්ෂයේ විකුණුම් රු. 5,362,247 ක් සමාලෝචිත වර්ෂයේ විකුණුම් ලෙස ගිණුම් ගතකර තිබුණි.

**2.2.2 ගිණුම්කරණ ප්‍රතිපත්ති**

දේපල පිරියත හා උපකරණ ක්ෂය රේට්යන් තීරණය කිරීමේදී ඉකුත් වර්ෂයේදී එය ප්‍රායෝගික වන පරිදි සංශෝධනය කර තිබූ නමුත් සමාලෝචිත වර්ෂයේ කිසිදු හේතුවකින් තොරව නැවතත් පැරණි ක්ෂය රේටයන් පදනම් කරගෙන ක්ෂය කර තිබුණි. මෙසේ ක්ෂය ප්‍රතිපත්තිය වෙනස් කිරීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ ක්ෂය රු. 670,048 ක් වැඩියෙන් ගිණුම් ගතකර තිබුණි.

**2.2.3 ගිණුම්කරණ අඩුපාඩු**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ගණනය කිරීමේ දෝෂ හේතුවෙන් ලැබිය යුතු බැංකු පොලී රු. 432,969 ක් අඩුවෙන් ගිණුම් ගතකර තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂය වෙනුවෙන් ගෙවිය යුතු ගොඩනැගිලි කුලී හා වාහන කුලී පිළිවෙලින් රු. 630,000 ක් හා රු. 195,000 ක් ගිණුම්ගත කර නොතිබුණි. එසේම 2013 වර්ෂයේ දී සමාලෝචිත වර්ෂය වෙනුවෙන් ගෙවන ලද රු.65,000 ක වාහන කුලී සමාලෝචිත වර්ෂයේ වියදම් ලෙස ගිණුම් ගතකර නොතිබුණි.

(ඇ) 2013 වර්ෂයට පෙර සිට ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාවට ගෙවිය යුතු රු. 900,000 ක් වූ ගෙවල් කුලී මුදලින් සමාලෝචිත වර්ෂය තුලදී කිසිදු හේතුවකින් තොරව රු. 270,000 ක් කපාහැර පෙර වර්ෂ ලාභයට බැර කර තිබුණි.

(ඈ) ආයතනයේ ගිණුම්කරණ ප්‍රතිපත්තිය අනුව ණයගැතියන්ගෙන් සියයට 2.5 බොල්ණය ප්‍රතිපාදනයක් සිදුකල යුතු වුව ද සමාලෝචිත වර්ෂය අවසානයේ රු. 2,869,544 ක අධි වෙන් කිරීමක් සිදුකර තිබුණි. ණයගැති ශේෂය තුළ 2006 වර්ෂයට පෙර සිට පැවතෙන රු.6,611,743 ක් හඳුනානොගත් ශේෂයක් පැවතියද බොල්ණය වෙන්කිරීමේදී ඒ පිළිබඳ සලකා නොතිබුණි.

(ඉ) 2003 වර්ෂයට පෙර සම්පූර්ණයෙන් ක්ෂය කර අවසන්ව තිබූ පිරිවැය රු. 3,048,451 ක් වූ ස්ථාවර වත්කම් කාණ්ඩ 3 කට අදාල වත්කම් 2011 සහ 2013 වර්ෂවල මිලදී ගැනීම් ලෙස සලකා නැවත ක්ෂය ගණනය කර තිබීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ ක්ෂය වියදම රු. 105,092 ක් වැඩියෙන් දක්වා තිබුණි.

(ඊ) සමාලෝචිත වර්ෂය තුලදී ගනුදෙනු අවසන් කර තිබූ විකුණුම් වෙනුවෙන් ලද රු.6,270,975 ක අත්තිකාරම් තවදුරටත් අත්තිකාරම් ලෙස ගිණුම්ගතකර තිබීම හේතුවෙන් වර්ෂයේ විකුණුම් ආදායම එම ප්‍රමාණයෙන් අඩුවෙන් දක්වා තිබුණි.

(උ) සමාලෝචිත වර්ෂය වෙනුවෙන් පිළියෙල කර තිබූ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය මගින් වසරේ මුදල් ප්‍රවාහය පිළිබඳ නිවැරදි තත්ත්වයන් වාර්තා කර නොතිබුණි. නිරීක්ෂණය වූ එවැනි අවස්ථා කිහිපයක් අතර මුදලින් ගෙවා තිබූ රු.170,566 ක්වූ කල් බදු පොලිය මුදල් ප්‍රවාහයක් ලෙස හඳුනාගෙන නොතිබීමද, මුදල් ප්‍රවාහයක් නොවන ලැබිය යුතු ආයෝජන ආදායම් රු.3,084,865 ක් හා වැරදි නිවැරදි කිරීම සඳහා යොදන ලද එකතුව රු.431,978 ක ජ'නල් සටහන් මුදල් ලැබීම් ලෙස සටහන් කිරීමද විය.

(ඌ) ආයතනය සතුව තිබූ ස්ථාවර තැන්පතු ආයෝජන ණයකර ආයෝජනයක් ලෙස පරිවර්තනය කිරීමේදී ලැබුණු රු. 98,200 ක ආදායම වර්ෂයේ ආදායමක් ලෙස හඳුනාගැනීම වෙනුවට ලැබිය යුතු පොලී ගිණුමට බැර කර තිබුණි.

### 2.2.4 පැහැදිලි නොකල වෙනස්කම්

ණයගැති උපලේඛනයේ සඳහන් ණයගැති ශේෂ, සනාථ ලිපි සමඟ සැසඳීමේදී ණයගැති ශේෂ 6 ක රු.5,947,445 ක වෙනසක් නිරීක්ෂණය විය.

### 2.2.5 විගණනය සඳහා සාක්ෂි නොවීම

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) මූල්‍ය ප්‍රකාශනවල හා ලෙජර් ගිණුම්වල දක්වා තිබුණු පහත සඳහන් විෂයයන් ඉදිරියෙන් දක්වා ඇති සාක්ෂි විගණනයට ඉදිරිපත් නොකිරීම නිසා ඒවා සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කිරීමට හෝ පිළිගැනීමට හෝ නොහැකි විය.

| | විෂයය | වටිනාකම | ඉදිරිපත් නොවූ ලිඛිත සාක්ෂි |
|---|---|---|---|
| | | රු. | |
| (i) | වියදම් | 18,219,536 | ගෙවීම් වවුචර 45ක් හා එයට අදාල විස්තර |
| (ii) | වෙළඳ ණයහිමියෝ | 142,712,254 | ණයහිමි කේවල ලෙජර, උපලේඛන හා ශේෂ සනාථ සහතික. |
| (iii) | කාර්යය ලිපිගොනු | 3,832,038 | ඉටු කිරීමට භාර ගන්නා ලද කාර්යයන් සම්බන්ධ ලිපිගොනු 03 |
| (iv) | ජනල් සටහන් | 517,693,567 | ජ'නල් වවුචර හා උපයෝගී ලියවිලි |
| (v) | බොල් ණය | 1,436,924 | ගණනය කිරීම් වලට අදාල තොරතුරු හා අනුමැතිය සහිත ලියවිලි |
| (vi) | පෙර වර්ෂ ලාභයට කරන ලද ගැලපීම | 47,512,113 | අදාල උපයෝගී ලේඛන |
| (vii) | ලැබිය යුතු රඳවාගත් බදු | 4,556,283 | රඳවා ගැනීමේ බදු සහතික |
| | එකතුව | 735,962,715 | |

(ආ) වර්ෂය අවසානයේ වූ ණයගැති ශේෂයෙන්, බැරපත් 17 ක් මඟින් එකතුව රු.17,438,107 ක් අඩුකර තිබූ නමුත් එම අඩු කිරීමට හේතුන් හෝ එසේ අඩු කිරීමට අදාල අනුමැතිය විගණනයට ඉදිරිපත් නොවීය.

2.3 නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

පහත දැක්වෙන අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

| නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| (අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | |
| (i) මුදල් රෙගුලාසි 137 හා 245 (1) | එකතුව රු. 51,820,329 ක්වූ ගෙවීම් වවුචර් 265 ක් හා එකතුව රු. 47,941,620 ක් වූ ගෙවීම් වවුචර් 123 ක් බලයලත් නිලධාරියා විසින් අනුමත හා සහතික කිරීම සිදුකර නොතිබුණි. |
| (ii) මුදල් රෙගුලාසි 156(5) | අවස්ථා 30 කට අදාල එකතුව රු. 26,202,237 ක් වූ ගිණුම් පොත්වල හා සම්බන්ධිත ලියවිලිවල සිදුකර තිබූ මකා දැමීම්, වෙනස්කිරීම් ආදිය සඳහා වගකිව යුතු නිලධාරියෙකු විසින් කෙටිසන් යොදා සහතික කර නොතිබුණි. |
| (iii) මුදල් රෙගුලාසි 395 (ආ) | බැංකු සැසඳුම් ප්‍රකාශ බලයලත් නිළධාරියා විසින් සහතික කර නොතිබුණි. |
| (iv) මුදල් රෙගුලාසි 395 (ඇ) | 2014 වර්ෂයට අදාළ බැංකු සැසඳුම් පිළියෙල කර විගණනයට ඉදිරිපත් කර තිබුණේ 2015 පෙබරවාරි මාසයේ දී විය. |
| (v) මුදල් රෙගුලාසි 395 (ඍ) | මුදල් පොත පවත්වාගෙන යන නිළධාරියා විසින්ම බැංකු සැසඳුම් සකස් කර තිබුණි. |
| (ආ) 1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය | ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීනව පවත්වා නොතිබුණි |

| | |
|---|---|
| (ඇ) 2000 ජුනි 27 දිනැති අංක පීඑෆ්/පීථ්/ 09 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය | භාණ්ඩාගාර අනුමැතියකින් තොරව රු.10,500,000 ක් ස්ථාවර තැන්පතුවල ආයෝජනය කර තිබුණි. |

**3. මූල්‍ය සමාලෝචනය**

**3.1. මූල්‍ය ප්‍රතිඵල**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ආයතනයේ මූල්‍ය ප්‍රතිඵලය රු.686,947 ක ශුද්ධ අලාභයක් වූ අතර ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ ශුද්ධ ලාභය රු. 13,210,742 ක් වුයෙන් මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.13,897,689 ක් හෙවත් සියයට 105ක පිරිහීමක් නිරීක්ෂණය විය. සමාලෝචිත වර්ෂයේ විවිධ කටයුතු ආදායම සියයට 45 කින් අඩු වී තිබීමද පරිපාලන වියදම් සියයට 32 කින් වැඩිවී තිබීමද පිරිහීමට ප්‍රධාන වශයෙන් බලපා තිබුණි.

**3.2 ආයතනයට එරෙහිව ආරම්භ කර ඇති නෛතික සිද්ධි**

බාහිර ආයතන දෙකක් විසින් නිර්මාණ කටයුතු වලට අදාළ මුදල් ලබාගැනීම සඳහා නඩු දෙකක් හා වැඩ තහනමට ලක්වූ සේවකයින් හතරදෙනෙකු විසින් නඩු අටක් ආයතනයට එරෙහිව පවරා තිබුණු අතර 2014 දෙසැම්බර් 31 දිනට නඩු කටයුතු වෙනුවෙන් රු. 285,000 ක් වැය කර තිබුණි.

**4. මෙහෙයුම් සමාලෝචනය**

**4.1 කළමනාකරණ අකාර්යක්ෂමතා**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2012 වර්ෂයේ සිට පැවතෙන සත්දින ඇමතුම් ආයෝජන වටිනාකම සමාලෝචිත වර්ෂයේ අවසන් දිනට රු. මිලියන 65 ක් ද සමස්ත ආයෝජනයෙන් සියයට 83 ක් ද වී තිබුණි. මෙම ආයෝජන ස්ථාවර තැන්පත් අයෝජන වශයෙන් පවත්වා නොගැනීම හේතුවෙන් ආයතනයට ලැබිය හැකි ආයෝජන පොලිය අඩු වී තිබුණි.

(ආ) රාජ්‍ය ආයතනයක සිදු කරන ලද රු.8,348,372 ක්වූ ප්‍රචාරණ වැඩසටහන් 03 ක් සඳහා ආයතනය විසින් මුදල් ලබාගෙන තිබුණද සිදුකිරීමට භාරගත් කටයුතු පිලිගත් ක්‍රමවේදයකින් තොරව උප කොන්ත්‍රාත් දී ඒ සම්බන්ධ පසුවිපරම් කටයුතු කිසිවක් සිදුකර නොතිබීම හේතුවෙන් මෙතෙක් කාර්යය අවසන් කර නොතිබුණි.

(ඇ) ඉටු කිරීමට භාර ගන්නා ලද කාර්යයන් වෙනුවෙන් වට්ටම් ලබාදීමද, ලාභ ප්‍රතිශතය තීරණය කිරීමද ආයතන ප්‍රධානියා විසින් සිදුකර තිබූ අතර ඒ සඳහා පිළිගත් සම්මත පදනමක් ආයතනය විසින් නිශ්චය කර නොතිබුණි.

## 4.2 මතභේදයට තුඩුදෙන ගනුදෙනු

ජනමාධ්‍ය හා ප්‍රවෘත්ති අමාත්‍යවරයාගේ පෞද්ගලික ලේකම්ගේ විදේශ ගමන් වියදම් වෙනුවෙන් සමාලෝචිත වර්ෂය තුළදී රු.135,000 ක් අනුමැතියකින් තොරව ආයතනය විසින් ගෙවා තිබුණි.

## 4.3 දෘශ්‍ය අක්‍රමිකතා

දුර්වල මූල්‍ය කළමනාකරණය, අභ්‍යන්තර පාලනයේ දුර්වලතාවය හා අභ්‍යන්තර විගණනය ක්‍රමානුකූලව ක්‍රියාත්මක නොවීම හේතුවෙන් ආයතනයේ නිලධාරීන් විසින් රු.11,988,000 ක මූල්‍ය වංචාවක් සිදුකර තිබුණි. මෙයට අදාල නිලධාරීන් සම්බන්ධව විධිමත් පරීක්ෂණයක් ආයතනය විසින් සිදුකර නොතිබුණි.

## 4.4 වාහන උපයෝජනය

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2003 මාර්තු 28 දිනැති අංක එම්එෆ්/පීආර්/01/2003 දරන මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශ ලේකම්ගේ ලිපිය ප්‍රකාරව වාහන කුළියට ලබාගත හැකි උපරිම මාසික කුළිය රු.40,000 ක් වුවත්, ඊට පටහැනිව සහ රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශයන් අනුගමනය කිරීමෙන් තොරව මාසික කුළිය රු. 65,000 ක් ගෙවීමේ පදනම මත වාහනයක් ලබා ගෙන සමාලෝචිත වර්ෂයේදී සීමාව ඉක්මවා රු.300,000 ක් ගෙවා තිබුණි.

(ආ) එක් එක් වාහනය සම්බන්ධයෙන් (කුළී පදනම මත ලබාගත් වාහනද ඇතුළුව) සමාලෝචිත වර්ෂය සඳහා සෑම මාසයක් සඳහාම භාවිතා කරන ලද ඉන්ධන ප්‍රමාණය, වටිනාකම, අළුත්වැඩියා හා නඩත්තු වියදම් විස්තර, ආයතනය භාරයේ ඇති වෙනත් රාජ්‍ය ආයතන සතු වාහන හා වෙනත් රාජ්‍ය ආයතන /අමාත්‍යාංශ වෙත ලබා දී ඇති ආයතනය සතු වාහන/කුළියට ගත් වාහන පිළිබඳ විස්තර විගණනය වෙත ඉදිරි පත් කර නොතිබුණි.

## 5. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය

### 5.1 ආයතනය පිහිටුවීම

මෙම ආයතනය 2001 දෙසැම්බර් 20 දින ජනසන්නිවේදන අමාත්‍යාංශය වෙත පවරා ගෙන තිබුණත්, එහි අරමුණු හා කාර්යයන් නිශ්චය කර බලතල ක්‍රියාත්මක කිරීමට පනතකින් හෝ වෙනයම් නීතියකින් විධිවිධාන සලසා නොතිබුණි. මෙම ආයතනය "සැලසිනෙ ලිමිටඩ් "ලෙස සමාගම් පනත යටතේ පොදු සමාගමක් ලෙස ලියාපදිංචි කිරීමට 2009 සිට කටයුතු කරමින් තිබුණද සමාලෝචිත වර්ෂය අවසානය වන විටත් එම කටයුතු අවසන් කර නොතිබුණි.

### 5.2 මුල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරිම

2003 ජූනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 6.5.1 වගන්තිය අනුව ගිණුම් වර්ෂය අවසාන වී දින 60 ක් ඇතුළත කෙටුම්පත් වාර්ෂික වාර්තාව හා මූල්‍ය ප්‍රකාශන විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවද 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2015 සැප්තැම්බර් 01 දිනදී එනම් දින 183 ක් ප්‍රමාදවී විගණනය වෙත ඉදිරිපත් කර තිබුණි.

**6. පද්ධති හා පාලනයන්**

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන දුර්වලතා ආයතනයේ සභාපතිවරයා වෙත වරින්වර පෙන්වා දෙන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතු වේ.

(අ) වත්කම් පාලනය

(ආ) ගිණුම්කරණය

(ඇ) මූල්‍ය පාලනය

එච්.එම්.ගාමිණී විජේසිංහ

විගණකාධිපති

## සැලසිනෙ රූපවාහිනී ආයතනයේ 2014 දෙසැම්බර් 31 වෙනි දිනෙන් අවසන් වර්ෂයට මූල්‍ය ප්‍රකාශන පිළිබඳව විගණකාධිපති වාර්තාව සඳහා පැහැදිලි කිරීම්

**2:2:1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති**

ඔබ විසින් පෙන්වාදෙන ලද රු.5,362,247.00 ක විකුණුම් මුදල ශ්‍රී ලංකා රාජ්‍ය ගිණුම්කරණ ප්‍රමිති අංක 01 ට අනුව උපචිත පදනම මත නෙපෙන්වීම පසුගිය වර්ෂයේ ඉදිරියට ගෙනා ලාභයට ගලපා නිවැරදි කිරීමට කටයුතු කරනු ලැබේ.

**2:2:2 ගිණුම්කරණ ප්‍රතිපත්ති**

ඉදිරියේ දී ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 07 ට අනුව කටයුතු කරන අතර, මූල්‍ය ප්‍රකාශනවල වැරදි ලෙස පෙන්වන රු. 670,048.00 ක වටිනාකම පෙර වර්ෂයේ ලාභයට ගලපා නිවැරදි කිරීමට ද කටයුතු කරමි.

**2:2:3 ගිණුම්කරණ අඩුපාඩු**

අ) ගණනය කිරීමේ දෝෂය හේතුවෙන් රු.432,969.00 ක මුදලක් අඩුවෙන් ගිණුම්ගත කිරීම පසුගිය වර්ෂයේ ලාභයට ගලපා නිවැරදි කිරීමට කටයුතු කරනු ලැබේ.

ආ) සමාලෝචිත වර්ෂයට අදාළව ගෙවිය යුතු රු.630,000.00 ක මුදල පෙර වර්ෂයේ ලාභයට හර කර උපචිත ගෙවල් කුලී ගිණුමට බැර කර නිවැරදි කරනු ලැබේ. වර්ෂයේ වාහන කුලී වශයෙන් ගිණුම් ගතකර තිබූ රු.195,000.00 ක මුදල පෙර වර්ෂයේ ලාභයට ගලපා නිවැරදි කරනු ලබන අතර, තවද 2013 වර්ෂයේ ඉදිරියට ගෙවූ වාහන කුලිය වන රු.65,000.00 ක මුදල පෙර වර්ෂයේ ලාභයට හර කර ඉදිරියට ගෙවූ වාහන කුලිය බැර කරන ලදී.

ඇ) 2013 වර්ෂයේ ගෙවල් කුලී ප්‍රතිපාදනය රු.900,000.00 ක් වූ අතර, එයින් රු.270,000.00 ක ගෙවල් කුලිය පෙර වර්ෂයේ ලාභයෙන් අඩු කිරීම වැරදීමකින් සිදුව ඇති බැවින් එය නැවත ලාභයට ගලපා නිවැරදි කරමි.

ඈ) බොල් හා අඩමාණ ණය සඳහා 2014 වර්ෂය සඳහා පෙර පරිදි 2.5% ක ප්‍රතිපාදනයන් ඇති කරන අතර, එය ඉදිරි වර්ෂයේ ලාභයට ගලපා නිවැරදි කරමි.

ඔබ විසින් පෙන්වා දී ඇති දින 90 ඉක්මවා ණය ශේෂය එකතු කරගැනීමට අවශ්‍ය පියවර දැන් ගෙන ඇත. පසුගිය කාලපරිච්ඡේදයේ හිඟව පැවති ණය ශේෂ දැන් ලැබෙමින් පවතින් අතර, ණය එකතු කිරීමේ ක්‍රියාමාර්ගය අඛණ්ඩව සිදුකෙරේ. ඔබගේ ලිපියේ සඳහන් 2006 වර්ෂයට පෙර හඳුනානොගත් ණය ශේෂය ලෙස පෙන්වන රු,6,611,743.00 ක වටිනාකම ණයගැතියන්ගෙන් කපාහැරීමට නිර්දේශ කර මහා භාණ්ඩාගාරයේ අනුමැතිය සඳහා යවා ඇත. (එහි පිටපත ඔබගේ දැනගැනීම පිණිස අමුණා එවා ඇත.)

ඉ) ස්ථාවර වත්කම් කාණ්ඩ 03 ක් වෙනුවෙන් පිරිවැය එකතු කිරීම හේතුවෙන් මූල්‍ය තත්ත්ව විස්තරයේ පෙන්වන ස්ථාවර වත්කම්වලට බලපෑමක් සිදුව නැත. මෙහි දී සිදුව ඇත්තේ එම වත්කම්වලට අදාළව ක්ෂයවීම් ගණනය කරන උපලේඛණයේ එහි පිරිවැය එකතු කරන අතරම, එම ක්ෂය ගණනය කරන ලේඛණයේ අඩු කිරීම් ලෙස එම වටිනාකම් පෙන්වන බැවින්, වටිනාකමේ වැඩිවීමක් සිදුව නැත. ඔබ විසින් පෙන්වා දී ඇති පරිදි එසේ උපලේඛණයේ පිරිවැය එකතුකර දැක්වීම නිවැරදි කිරීමට කටයුතු කරමි.

ඊ) රු.6,270,975.00 ක අවසන් කර තිබූ විකුණුම් වෙනුවෙන් ලද මුදල තව දුරටත් අත්තිකාරම් ලෙස ගිණුම්ගතකර තිබීමේ හේතුව නිසා පෙර වර්ෂයේ ලාභයට ගලපා නිවැරදි කිරීමට කටයුතු කරනු ලැබේ.

උ) ඔබගේ නිරීක්ෂණය නිවැරදි වන අතර, එය පසුගිය ඉ/ගෙ ලාභයට ගලපා නිවැරදි කරනු ලැබේ. මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ බලපෑම ගණනය කිරීමේ දී අඩුකර නොමැති කල්බදු පොලී වියදම අඩුකර මුදල් ප්‍රවාහ ප්‍රකාශනයට ගලපා නිවැරදි කිරීමට කටයුතු කරමි. මුදල් ප්‍රවාහ ප්‍රකාශනයට ලැබිය යුතු ආයෝජන ආදායම් රු.3,084,865.00 මුදල් ලද ආයෝජන ලෙස වැරදි ලෙස ඇතුළත් කිරීම මුදල් ප්‍රවාහ ප්‍රකාශනයට ගලපා නිවැරදි කිරීමට කටයුතු කරමි.

ඌ) ස්ථාවර තැන්පතු ආයෝජනයක් ණයකර ආයෝජනයක් ලෙස ලැබුණු රු.98,200.00 ක් පෙර වර්ෂයේ ලාභයට ගලපා නිවැරදි කිරීමට කටයුතු කරනු ලැබේ.

**2:2:4 පැහැදිලි නොකළ වෙනස්කම්**

ශ්‍රී ලංකා සංචාරක මණ්ඩලයට අදාළව රු.2,200,148.00 ක් වටිනාකමට ඉන්වොයිස් නිකුත් කර තිබූ අතර, ඒ අනුව අපගේ ණයගැති ලෙජරයට එය ඇතුළත් විය. කෙසේ වෙතත් මේ සම්බන්ධයෙන් අදාළ සේවාදායක සමඟ ලිපි ගනුදෙනු කරමින් පවතින අතර, ඉන් පසුව මෙම ණයගැති ශේෂය නිරවුල් කිරීමට අවශ්‍ය කටයුතු සිදුකරනු ලැබේ.

වරාය හා මහාමාර්ග අමාත්‍යාංශය රු.239,097.00 මෙකී වනසට හේතු වී ඇත්තේ අප විසින් පුවත්පත් දැන්වීමක් පල කිරීමේ දී සිදුව ඇති වැරදීමකින් අදාළ ගෙවීම පිළිබඳ දැනට පවත්නා ප්‍රශ්නකාරී තත්ත්වයකි. එය නිරවුල් කරගැනීම පිළිබඳව දැනට කටයුතු කරමින් පවතී. ඉන් අනතුරුව මෙම වැරදි නිවැරදි කිරීමට කටයුතු කරමි.

මහ කොළඹ ජල කළමනාකරණය :- රු.8,164.00 ක වෙනසක් ණයගැති ලෙජරයේ ඇතිවීමට හේතු වී ඇත්තේ ඉන්වොයිස් කිරීමේ දී (Art work) සඳහා කරන ලද අය කිරීම් සේවා දායකයා විසින් ගිණුම්ගත නොකිරීමයි. එනිසා මෙම ගැටලු හටගෙන ඇති අතර, අදාළ පාර්ශ්වය සමඟ මේ පිළිබඳව එකඟතාවය ඇත කරගෙන මෙය නිවැරදි කිරීමට කටයුතු කරමි.

**2:2:5 විගණනය සඳහා සාක්ෂි නොවීම්**

අ) (I) ගෙවීම් වවුචර් 45 ක් හා එයට අදාළ විස්තර මෙම කරුණට සම්බන්ධ වූ වගකිව යුතු නිලධාරීන්ට විරුද්ධව නීති මගින් කටයුතු කරනු ලැබේ.

(II) වෙළෙඳ ණයගැතියන්ගෙන් රු.142,712,254.00 ක ණයගැති උපලේඛන ඔබ වෙත එවා ඇත.

(III) කාර්යය ලිපිගොනු 03 ක් (වටිනාකම රු.3,832,038.00) සම්බන්ධව සොයා බලන අතර, ඒවා සම්බන්ධයෙන් වගකිව යුතු නිලධාරීන් දැනට සේවයේ නොමැති අතර, ඔවුන්ට විරුද්ධව නීති මගින් කටයුතු කරනු ලැබේ.

(IV) මෙයට අදාළ ජර්නල් සටහන් ඔබ වෙත එවා ඇත.

(V) ඔබගේ ලිපියේ සඳහන් ණයගැතියන්ගෙන් අඩමාණ ණය වෙන් කිරීමට අදාළව රු.1,436,924.00 දැක්වෙන අතර, 2014 වර්ෂයේ අඩමාණ ණය වෙන් කිරීමේ දී අඩුවෙන් කළ මුදල ඉදිරි වර්ෂයේ ලාභයට ගලපා නිවැරදි කිරීමට කටයුතු කරමි.

(VI) පෙර වර්ෂයේ ලාභයට කරන ලද ගැළපීම් රු.47,512,613.00 මෙයට අදාළ උපලේඛන ඔබ වෙත එවා ඇත.

(VII) ලැබිය යුතු බදු රු.4,556,283.00 කි. මීට අදාළ බදු සහතික පත්‍රවලට අදාළ තහවුරුව බැංකුවෙන් ලබා මේ සමඟ ඔබ වෙත එවා ඇත.

ආ) රු.405,872.00 ක වටිනාකමින් යුතු ණය ශේෂය පිළිබඳව ණයගැතියන් වෙත බදු ඉන්වොයිස් නිකුත් කළ පසු විවිධ හේතු නිසා ගණුදෙනුකරුවන් ඒවා අවලංගුකර ඇති නිසා ප්‍රතිශෝධනයන් සිදුව ඇත. ඒ සඳහා බැරපත් නිකුත් කර ඇත. බැරපත් 17 ට අදාළ වටිනාකම වූ රු.17,438,107.00 ක් වෙනුවෙන් වූ බැරපත් ඔබ වෙත ලබාදී ඇත.

**2:3 නීතිරීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම.**

| | | | |
|---|---|---|---|
| (අ) (I) | මු.රෙ 245 (1) | සහතික කරන ලද නිලධාරියා විසින් නියමිත ගිණුම් වවුචර් සහතික කළ යුතු වුවද එම වටිනාකම රු.47,941,620.00 ක් වූ ගෙවීම් වවුචර් 123 ක් බලයලත් නිලධාරියා විසින් සහතික කර නැත. | මෙම වැරදිවලට සම්බන්ධ නිලධාරීන් ආයතනයෙන් ඉවත් වී ඇති අතර, මේ සම්බන්ධයෙන් පරීක්ෂණ කටයුතු දිගටම සිදුවෙමින් පවතී. මෙම තත්ත්වය වර්තමානයේ සිදු නොවන අතර, මූල්‍ය බලතල පිළිපදිමින් ක්‍රියාත්මක කරනු ලැබේ. |
| | මු.රෙ 137 | අනුමත කිරීමේ නිලධාරියා විසින් සියලුම ගෙවීම් වවුචර් අනුමත කළ යුතු වුවද, මුළු වටිනාකම රු.51,820,329.00 ක් ගෙවීම් වවුචර් 220 ක් බලයලත් නිලධාරියා අනුමත කර නොතිබුණි. | මේ සම්බන්ධයෙන් ක්‍රියා කළ පුද්ගලයන් ආයතනයෙන් ඉවත්ව ගොස් ඇති අතර, එම අයට විරුද්ධව නීත්‍යානුකූල ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කර ඇත. |
| (II) | මු.රෙ 156 (5) | ගිණුම්වල හෝ ඒ හා සම්බන්ධව මොනයම් ලියවිල්ලක හෝ මකා දැමීම් දිස් නොවිය යුතුය.<br><br>එකතුව රු. 26,202,237.00 | මෙවැනි දුර්වලතා හේතු වූයේ ගිණුම් අංශයේ ගණකාධිකාරීවරයෙකු නොසිටීමත්, පළපුරුදු නිලධාරීන් නොසිටීමත් නිසාය. මෙම අඩුපාඩු ඉදිරියේ දී සිදුනොකරන ලෙස නිලධාරීන් දැනුවත් කරන ලදී. |
| (III) | මු.රෙ 395 (ආ) | දෙපාර්තමේන්තුවේ මුදල් පොත අනුව ඇති ශේෂය සමඟ සැසඳීමට බැංකු සැසඳුම් ප්‍රකාශය නම් වූ ප්‍රකාශයක් පිළියෙල කළ යුතුය. එය ඒ හා සම්බන්ධ ගෙවන නිලධාරියා විසින් සහතික-කොට විගණකාධිපති දෙපාර්තමේන්තුව මගින් පරීක්ෂා කිරීම සඳහා සූදානම්ව තිබිය යුතු වුවද ඉහත සඳහන් බැංකු සැසඳුම් සහතික කර නොතිබුණි. | ගිණුම් කටයුතු පිළිබඳ පළපුරුදු නිලධාරීන් නොසිටීමත්, ගණකාධිකාරීවරයෙකු නොසිටීමත් යන කරුණු නිසා මෙම වැරදි සිදුවී ඇත. මෙම වැරදි නිවැරදි කර වැඩ රාජකාරී බෙදීම තුළින් මුදල් පොත නඩත්තු කරන අය බැංකු සැසඳුම් පිළියෙල නොකරන පරිදි වැඩ බෙදා ඇත. ඒ අනුව මෙම තත්ත්වය නිවැරදි කර ඇත. |

| | | |
|---|---|---|
| (IV) මු.රෙ 395 (ඇ) | එක් එක් මාසය අවසානයේ දී ඇති ගණුදෙනු තත්ත්වය සම්බන්ධයෙන් ඊළඟ මාසයේ 15 වෙනි දිනට පෙර බැංකු සැසඳුම් ප්‍රකාශයක් පිළියෙල කළ යුතු වුවද, 2014 වර්ෂයට අදාළව බැංකු සැසඳුම් පිළියෙල කර විගණනයට ------ | මෙම කාලසීමාව තුළ ගිණුම් කටයුතු පිළිබඳ පළපුරුදු නිලධාරීන් නොසිටීමත්, ගණකාධිකාරීවරයෙකු නොසිටීමත් යන කරුණු නිසා බැංකු සැසඳුම් පිළියෙල වී නොමැති අතර, ඉදිරියේ දී මෙම වරද සිදුනොවන අතර, නියමිත දිනට බැංකු සැසඳුම් පිළියෙල කරනු ලැබේ. |
| (V) මු.රෙ 395 (ඌ) | මුදල් රෙගුලාසි නියමයන්ට පටහැනිව ආයතනයේ මුදල් පොත පවත්වාගෙන යන නිලධාරියා විසින් ම බැංකු සැසඳුම් සකස් කිරීම ද කර තිබුණි. | නිලධාරීන් අතර වැඩ බෙදීම සිදු නොවීම නිසා මෙම වරද සිදුවී ඇත. නිලධාරීන් ප්‍රමාණවත් පරිදි නොසිටීම ද වර්තමානයේ නිලධාරීන් අතර රාජකාරී බෙදා මනා වැඩ බෙදීමක් සිදුකර මෙම වැරදි සිදු නොවීමට කටයුතු යොදා ඇත. |
| (ආ) 1978 දෙසැ. 19 දිනැති අංක 842 දරන භාණ්ඩාගාරික චක්‍රලේඛය | ස්ථාවර වත්කම් ලේඛණය හා ස්ථාවර වත්කම් ලෙජරය යාවත්කාලීනව පවත්වාගෙන ගොස් නොතිබුණි. | ස්ථාවර වත්කම් ලේඛණය නිසි ලෙස සකස්කර නොපමාව ඔබ වෙත ඉදිරිපත් කිරීමට කටයුතු යොදා ඇත. |
| (ඇ) 2000 ජුනි 27 දිනැති පීඑෆ්/පීඊ 09 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය | ස්ථාවර තැන්පතුවල ආයෝජනය කරන ලද රු. 10,500,000.00 ක ආයෝජන සඳහා භාණ්ඩාගාර අනුමැතිය ලබාගෙන නොතිබුණි. | ස්ථාවර තැන්පතුවල ආයෝජනය සම්බන්ධයෙන් භාණ්ඩාගාරයේ අනුමැතිය ලබාගැනීමට කටයුතු කරමි. |

## 3. මූල්‍ය සමාලෝචනය

### 3.1 මූල්‍ය ප්‍රතිඵල

2014. 12. 31 වෙනි දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය ප්‍රතිඵලය රු. 686,947.00 ක අලාභයක් ඇතිවීමට හේතු වූයේ අපේක්ෂිත ආදායම පෙර වර්ෂයට වඩා 31% කින් අඩුවීමත්, අපගේ පොදුකාර්යය වියදම් සඳහා විශාල මුදලක් දැරීමට සිදුවීමත් නිසාය. විශේෂයෙන්ම ගොඩනැගිලි අලුත්වැඩියා, සේවක සුභසාධන කටයුතු, ගොඩනැගිලි සඳහා නෛතික හිඟ ගෙවීම් සිදුකිරීම වැනි හේතූන් මත පසුගිය වසරට වඩා 32% කට වැඩි වියදමක් දැරීමට සිදුවිය. වෙළෙඳපොලේ පවතින දැඩි තරඟකාරීත්වය ද මෙයට බලපාන ලදී. මෙම තත්ත්වය ව්‍යාපාරික මූල්‍ය තත්ත්වයට සෘජුව බලපෑම ඇතිවීම මත මෙසේ අලාභයන් උද්ගතවීමට හේතු විය. කෙසේ වෙතත් ඉදිරියේ දී මෙම වියදම් දැඩි පාලනයක් සහිතව කිරීමට කටයුතු යොදා ඇත. ඒ අනුව අපේක්ෂිත ලාභය, ඉලක්කයන් ළඟා කරගැනීමට සෑම ප්‍රයත්නයක් ම දරනු ලැබේ.

### 3.2 ආයතනයට එරෙහිව ආරම්භකර ඇති නෛතික සිද්ධි

බාහිර ආයතන දෙකක් විසින් නිර්මාණ කටයුතුවලට අදාළ මුදල් ලබාගැනීම සඳහා වූ නඩු 02 ක් ද, හිටපු සේවකයින් 04 දෙනෙකුගේ වැඩ තහනම් කිරීමට අදාළව පවරා තිබූ නඩු කටයුතු වෙනුවෙන් මෙම රු. 285,000.00 ක නීති වියදම් දැරීමට සිදුවිය.

## 4. මෙහෙයුම් සමාලෝචනය

### 4.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

(අ) 2014 වර්ෂයේ සත් දින ඇමතුම්වල ආයෝජනය කළ මුදල රු. මිලියන 65 කි. මෙම මුදල් එසේ ආයෝජනය කිරීමට හේතු වූයේ දේශීය ආදායම් බදු දෙපාර්තමේන්තුව සඳහා ගෙවිය යුතු වැට් බදු මුදල කොපමණදැයි නිරාකරණය වනතුරු තාවකාලිකව මුදල් ආයෝජනය කිරීමක් වශයෙනි. ඒවා අධික පොලී ලැබෙන ස්ථාවර තැන්පතුවල ආයෝජනය කිරීම මගින් විශාල පොලියක් ලැබෙන බව සත්‍ය නමුත්, දේශීය ආදායම් බදු දෙපාර්තමේන්තුව වෙත කළ යුතු වැට් බදු ගෙවීම ප්‍රමාද වුවහොත් ව්‍යාපාරයේ බැංකු ගිණුම් අත්හිටුවීම සිදු කරන බැවින්, එම දැඩි අවදානම් තත්ත්වය නැතිකරනු වස්, කෙටිකාලීනව මුදල් ඉවත් කළ හැකි වන ලෙස මෙම ආයෝජනය සිදුකර ඇත.

(ආ) ඔබ වෙත පෙන්වාදුන් ප්‍රචාරණ වැඩසටහන් වෙනුවෙන් රු.8,348,372.00 ක මුදලක් අප වෙත ලැබී තිබූ අතර, ඒ සඳහා විධිමත් ටෙන්ඩර් ක්‍රියාපරිපාටීන්ට අනුකූලව ක්‍රියාකර තිබුණ ද, ඒවා ක්‍රියාත්මක කිරීමේ දී අඩුපාඩු සිදු වී ඇත. එම වැරදි ඉදිරියේ දී නිවැරදි කරගැනීමට ක්‍රියාකරන බව සඳහන් කරමි.

(ඇ) මෙම ආයතනය සඳහා ආදායම් ලැබෙන මාර්ග අතරින් එකක් වනුයේ උපලේඛනගත කිරීම් වේ. මෙහි දී අදාළ දැන්වීම් ලබාගන්නා ආයතන අතුරින් ප්‍රධාන ගනුදෙනුකරුවන්ට වට්ටම් සහන ලබාදීම සිදුකෙරේ. මෙයට හේතු වන්නේ එම ආයතන දිගටම අප ආයතනය වෙත රඳවා ගැනීම තුළින් ආයතනයේ ආදායම් මාර්ගය සුරක්ෂිත කරගැනීමේ අරමුණෙනි. ඉහළ කළමනාකරණය විසින් මෙම වට්ටම් අගය ගනුදෙනු පරිමාව, ගනුදෙනුකරු පැරණිවීම යන සාධක සැලකිල්ලට ගෙන සිදුකරනු ලැබේ.

### 4.2 මතභේදයට තුඩුදෙන ගනුදෙනු

ජනමාධ්‍ය හා ප්‍රවෘත්ති අමාත්‍යවරයාගේ පෞද්ගලික ලේකම්ගේ විදේශ ගමන් වියදම් මෙම ආයතනයෙන් දැරීමට හේතු වී ඇත්තේ, එම නිලධාරියා මෙම ආයතනයේ අධ්‍යක්ෂ මණ්ඩලයට පත්ව එහි කටයුතු ඉටු කර ඇති නිලධාරියෙකු වූ බැවිනි. ඒ සඳහා වූ වියදම මෙම ආයතනය විසින් දැරීමට කටයුතු කර ඇත.

### 4.3 දෘශ්‍ය අක්‍රමිකතා

ආයතනයේ සිදු වූ රු. 11,988,000.00 ක මූල්‍ය වංචාව සම්බන්ධයෙන් මූලික පරීක්ෂණයක් පවත්වන අතර, අමාත්‍යාංශ මට්ටමින් ද පරීක්ෂණයක් පවත්වා ඇති අතර, ඊට අමතරව මූල්‍ය අපරාධ විමර්ශන කොට්ඨාශය මගින් මූලික පරීක්ෂණයක් පවත්වන අතර, ඊට අදාළ චූදිතයින්ට විරුද්ධව නීතිමය කටයුතු දැනට සිදුකරගෙන යනු ලැබේ.

### 4.4 වාහන උපයෝජනය

(අ) මෙම ආයතනය සතුව සභාපති සඳහා සුදුසු වාහනයක් නොමැති බැවින්, ඒ සඳහා කුලියට වාහනයක් ලබාගෙන ඇත. 2003 මාර්තු 28 වෙනි දිනැති මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශයේ ලේකම්ගේ එම්එස්/ටීආර්/01/2003 ලිපිය ප්‍රකාරව එම අවස්ථාවේ දී වාහන මිල ගණන් කැඳවා ලබාගැනීමට ක්‍රියා කළ ද, සුදුසු වාහනයක් එවැනි මිල ගණන් යටතේ ලබාගත නොහැකි වූ නිසා මෙම මිල යටතේ වාහනය ලබාගෙන ඇත. මෙම චක්‍රලේඛය පරිදි ඉදිරියේ දී ඒ සඳහා අවශ්‍ය අනුමැතිය ලබාගැනීමට කටයුතු කරනු ලැබේ.

(ආ) වාහන උපයෝජනය සම්බන්ධව ඔබ විසින් ඉල්ලා ඇති විස්තර මේ සමඟ එවා ඇත.

## 5. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය

### 5.1 ආයතනය පිහිටුවීම

මෙම ආයතනය සඳහා නීතිමය ප්‍රතිපාදන ඇති කිරීම සඳහා සෑහෙන පරිශ්‍රමයක් දරන අතර, ජනමාධ්‍ය අමාත්‍යාංශය යටතට පත්වීමෙන් අනතුරුව රජයට අයත් සීමිත පොදු සමාගමක් ලෙස පත් කිරීමට කැබිනට් පත්‍රිකාවක් 2014 වර්ෂයේ ඉදිරිපත් කර ඒ සඳහා කැබිනට් මණ්ඩල අනුමැතිය ද ලබාගෙන මුදල් අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කර ඇත. මේ සම්බන්ධයෙන් භාණ්ඩාගාරය සමග සාකච්ඡා පවත්වමින් සිටින අතර, මෙම තත්ත්වයට පිළියමක් ඉතා නුදුරේම ලබාගැනීමට ආයතනය අපේක්ෂා කරනු ලැබේ.

### 5.2 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

මහා භාණ්ඩාගාර චක්‍රලේඛ පීඊඩී/12 හා 2013/6/12 වෙනි දිනැති රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ 6:5:1 වගන්තිය පරිදි ගිණුම් වර්ෂ අවසානවීමට දින 60 ක් ඇතුළත කෙටුම්පත් වාර්ෂික වාර්තාව හා මූල්‍ය ප්‍රකාශන සකස්කර විගණකාධිපති හා එහි පිටපත් අමාත්‍යාංශය හා භාණ්ඩාගාරයට ඉදිරිපත් කිරීමට නොහැකි වී ඇත්තේ මෙම කාලසීමාව තුළ ගිණුම් පිළියෙල කිරීම සඳහා මෙම ආයතනයේ ගණකාධිකාරවරයෙකු නොසිටි බැවිනි. මේ නිසා වරලත් ගණකාධිකාරී ආයතනයක් මගින් ගිණුම් පිළියෙල කර ගිණුම් ඉදිරිපත් කිරීමට සිදු වූ බැවින්, ඒ සඳහා කාලසීමාවක් ගත විය. එසේ ඉදිරිපත් කළ ගිණුම් වාර්තාවේ පැවති අඩුපාඩුකම් රාශියක් පසුව අනාවරණය වීම නිසා එවැනි දෝෂයන් නිවැරදි කර නැවත එවීමට ද සිදු වූ බැවින් මෙසේ කාල ප්‍රමාදයන් උද්ගතවීමට හේතු විය. කෙසේ වුවද ඉදිරියේ දී ආයතනයේ පුරප්පාඩු ද සම්පූර්ණ වී ඇති බැවින්, නියමිත කාලසීමාව තුළ ගිණුම් වාර්තා ප්‍රමාදයකින් තොරව එවීමට කටයුතු කරනු ලැබේ.

## 6. පද්ධති හා පාලනයන්

ආයතනයේ ගිණුම් කටයුතු වඩා හොඳින් කරගෙන යෑමට අලුතෙන් පරිගණක පැකේජයක් හඳුන්වාදුන් අතර, එය 2015 මැද සිට ක්‍රියාත්මක වේ. ඒ අනුව ඔබ විසින් පෙන්වා දී ඇති පහත සඳහන් අඩුපාඩු ඉක්මනින් නිවැරදි කිරීමට අවශ්‍ය කටයුතු සිදු කරනු ලැබේ.

**අ) වත්කම් පාලනය**
භාණ්ඩාගාර චක්‍රලේඛ අංක 842 ට පරිදි ස්ථාවර වත්කම් පාලන ලේඛණයට අනුව කටයුතු කරනු ලැබේ.

**ආ) ගිණුම්කරණය**
ගිණුම්කරණ කටයුතු වඩාත් නිවැරදි කිරීමට ඒ සම්බන්ධයෙන් වැරදි හා වංචාවක් සිදු නොවන ලෙසට අභ්‍යන්තර පරීක්ෂාව තහවුරු වන ලෙසට ගිණුම් පද්ධතිය සකස් කිරීමට කටයුතු යොදා ඇත. ඒ තුළින් නිවැරදි ගිණුම් දත්ත ලබාදීමට කටයුතු යොදා ඇත.

**ඇ) මූල්‍ය පාලනය**
මූල්‍ය පාලනය ශක්තිමත් කිරීම සඳහා පරිගණක තාක්ෂණය යොදා ගන්නා අතර, නවීන ගිණුම් පැකේජයක් ඒ සඳහා යොදා ඇත. ඒ අනුව ආයතනයේ ගිණුම් පිළියෙල කිරීමත්, ඒවායේ නිරවද්‍යතාවය ආරක්ෂා කරගැනීමත්, කඩිනමින් අවශ්‍ය තොරතුරු ලබාදීමටත් හැකි තත්ත්වයට ගෙන ඒමට සැලසුම්කර ඇත.

**සභාපති**
සැලසිනෙ රූපවාහිනී ආයතනය

සැලසිනෙ
செலசினே
SELACINE
SELACINE TELEVISION INSTITUTE

SELACINE TELEVISION INSTITUTE
No. 224, Bauddhaloka Mawatha, Colombo 7, Sri Lanka
Tel. : 011 432 0777, 011 205 8227 Fax : 011 205 8229
E mail : info@selacine.lk
www.selacine.lk